MILCO®
දේශයේ අභිමානය

# මිල්කෝ (පුද්) සමාගම

නො. 45, නාවල පාර, නාරහේන්පිට, කොළඹ 05.

# වාර්ෂික වාර්තාව

# 2016

ජනවාරි - දෙසැම්බර්

மில்கோ (தனி) நிறுவனம்

# வருடாந்த அறிக்கை

# 2016

ஜனவரி - டிசம்பர்

Milco (Pvt) Ltd

# Annual Report

# 2016

January - December

## අපගේ දැක්ම

මිල්කෝ සමාගම ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පෝෂ්‍යදායී
ආහාරපාන
සමාගම බවට පත්කිරීම

## අපගේ මෙහෙවර

දේශීය කිරි ගොවියා ශක්තිමත් කරමින්, නැවුම් කිරි නිෂ්පාදනයේ
ඉලක්ක ගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහිලා ක්‍රියාකාරී
පාර්ශවකරුවකු වීම.
අපගේ වටිනා පාරිභෝගිකයන් හට දැරියහැකි මිලට
පෝෂ්‍යදායී ආහාරපාන සැපයීම වස් නවීන තාක්ෂණයෙන් හෙබි
අඛණ්ඩ අභිවෘද්ධි ප්‍රවේශයන් අනුගමනය කිරීම.



# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 1 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 2 - 3 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 4 - 5 |
| ආයතනික පාලනය | 6 |
| විගණකවරුන්ගේ වාර්තාව | 7 - 10 |
| ආදායම් ප්‍රකාශය | 11 |
| ශේෂ පත්‍රය | 12 |
| ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය | 13 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 14 - 15 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 16 - 48 |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක සටහන් | 49 - 52 |
| විශේෂ මූල්‍ය සිදුවීම් | 53 |





DSSPI - Tel: 2847042 / 2849600 Fax: 2851348

# සංස්ථානික තොරතුරු

| | |
|---|---|
| සමාගමේ නම | - මිල්කෝ (පුද්ගලික) සමාගම |
| නෛතික තත්ත්වය | - 1982 සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සීමාසහිත පුද්ගලික සමාගමකි |
| ලියාපදිංචි කාර්යාලය | - අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05<br>- දුරකථන: 0112586174, 0114500541<br>- ෆැක්ස්: 0112368082/ 0112577540/0114500555<br>- වෙබ් අඩවිය: www.milco.lk<br>- විද්‍යුත් තැපැල: info@milco.lk |
| කර්මාන්ත ශාලා | - කොළඹ කිරි කර්මාන්ත ශාලාව<br>- අඹේවෙල විසිරි වියළි කිරි කර්මාන්ත ශාලාව<br>- දිගන කිරි කර්මාන්ත ශාලාව<br>- පොලොන්නරුව උකු කිරි කර්මාන්ත ශාලාව |
| සංස්ථාගත කළ දිනය | - 1996 මැයි 09 |
| නැවත ලියාපදිංචි කළ දිනය | - 2008 මැයි 19 |
| සමාගම් ලියාපදිංචි අංකය | - N (PVS) 17159 (පැරණි)<br>- PV 2942 (නව) |
| සමාගමේ ලේකම්වරු | - ෆයිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් ඒජන්සීස් (පුද්) සමාගම අංක 300/3, නාවල පාර, නාවල |

| අධ්‍යක්ෂවරු | | |
|---|---|---|
| | - කේ.පී.පී.එච්. මිහිරිපැන්න මහතා | - සභාපති |
| | - පාලිත සමරකෝන් මහතා | - නියෝජ්‍ය සභාපති |
| | - ඒ.ඒ.ටී.එස්. අමරසිංහ මහතා | - ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| | - බියංකා එන් ගමගේ මිය | - අධ්‍යක්ෂ |
| | - එම්.පී.සරත් අබේරත්න මහතා | - අධ්‍යක්ෂ |
| | - ජේ.ඒ.එස්. ජයකොඩි මහතා | - අධ්‍යක්ෂ |
| | - ඒ.එම්.ආර්.බී. අලහකෝන් මහතා | - අධ්‍යක්ෂ |
| | - බී.ඩී. මහිලාල් චන්දිම මහතා | - අධ්‍යක්ෂ |
| | - එම්.එච්.එම්. ෆසාල් මහතා | - අධ්‍යක්ෂ |

| | |
|---|---|
| විගණකවරු | - අභ්‍යන්තර<br>අර්න්ස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම<br>201, ද සේරම් පෙදෙස, කොළඹ 10<br><br>- බාහිර<br>එස්ජේඑම්එස් ඇසෝසියේට්ස්<br>අංක 201, කාසල් වීදිය,කොළඹ 10.<br><br>- රජයේ විගණනය<br>විගණකාධිපති |
| බැංකුකරුවෝ | - මහජන බැංකුව<br>- ලංකා බැංකුව |

සීමාසහිත මිල්කෝ පුද්ගලික සමාගමේ 2016 වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය යොමු කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

කිරි නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ පශුසම්පත් කර්මාන්තය තුළ ඉතාම වැදගත් උප අංශයක් නියෝජනය කරනු ලබන අතර ග්‍රාමීය ආර්ථිකය තුළ නැවුම් කිරි සහ කිරි නිෂ්පාදනවල වැඩිවෙන ඉල්ලුමට බලපෑම් ඇති කරයි. නිෂ්පාදනයේ සහ ඵලදායීතාවයේ වැඩිවීමට අමතරව, කිරිනිෂ්පාදන අගය දාමයේ සියලු පාර්ශ්වකරුවන් සඳහා වන වෙළෙඳ පොළ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වෙයි.

මිල්කෝ පුද්ගලික සමාගම, රජයට හිමි ප්‍රධාන සමාගමක් වන අතර එමගින් කිරි ගොවියන්ගෙන් මාසිකව නැවුම් කිරි ලීටර මිලියන 5.8 කට ආසන්න ප්‍රමාණයක් එක් රැස්කර කිරි නිෂ්පාදනය කරනු ලබයි.

මිල්කෝ ආයතනයට රජයේ ප්‍රතිපත්ති සහ සහනාධාර ක්‍රියාත්මක කිරීමට සිදුවුවද ශීඝ්‍ර වර්ධනයක් සඳහා වන අපගේ ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ වෙළෙඳ පොළ අරමුණු කරගත් කිරි නිෂ්පාදන අලෙවිකරණයක් සිදුකිරීම වේ.

මෙම වසර තුළදී ළඟා කරගත් ප්‍රධාන ජයග්‍රහණයන් පහත පරිදිවේ.

**මෙහෙයුම් පරිසරය**

වසර තුළඅමු කිරි එක් රැස්කිරීම ලීටර මිලියන 64.6 සිටමිලියන 70 දක්වා වැඩිවූ අතර එයපෙර වසරට වඩා ලීටර මිලියන 5.4 ක වැඩිවීමක "සහ 8% ක වර්ධනයකි. පසුගිය වසරේ ලීටරයක සාමාන්‍ය මිල රු.63.94 ක් වූ අතර මේ වසරේදී එය රු.67.44 ක් විය. මීට අමතරව අමු කිරි මිලදීගැනීමේ පිරිවැය රු.මිලියන 593 ක් වූ අතර එය පසුගිය වසරට වඩා 14% ක වැඩිවීමකි.

**සමාගමේ ශක්තීන්**

වසර 60 ක කාලයක් පුරා දේශීය කිරි නිෂ්පාදන අංශය තුළ නායකත්වය දැරීම අප හට කීර්තියක් ගෙන දෙන්නකි. මෙම දශක හයක කාලය තුළ සමාගම පාරිභෝගික විශ්වාසය සම්බන්ධ නොබිඳිය හැකි පදනමක් සකසාගෙන තිබේ. සම්පූර්ණයෙන් රජයට අයත් සමාගමක් ලෙස අපගේ ගොවියන් අතර ශක්තිමත් සබඳතාවක් සහ විශ්වාසයක් ගොඩනගා ගැනීමට හැකිව ඇති අතර එය අපගේ ආයතනයට ප්‍රබල ජවයක් ලබාදෙයි.

අපගේ තවත් ශක්තියක් වන්නේ දිවයින පුරා විසිරී ඇති කිරි එකතු කිරීමේ ජාලයයි. එය අපට නැවුම් සහ ගුණාත්මක බවින් උසස් කිරි ලබාගැනීමට හැකියාව සපයමින් අපගේ නිෂ්පාදනවල උසස් තත්වය තහවුරු කරයි. හොඳින් පුහුණුව ලැබූ විස්වසනීය කාර්ය මණ්ඩලය අපගේ සමාගමේ සුවිශාලතම ශක්තිය වේ.

**ජයග්‍රහණ සහ ප්‍රධාන සන්ධිස්ථාන**

වසර තුළදී කර්මාන්ත ශාලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූඅතර මෙම ව්‍යාපෘතිය යටතේ 2015 වසරේ අවසන් භාගයේදී පොළොන්නරුව කර්මාන්ත ශාලාව නවීකරණයකර අවසන් කර 2016 දී දිගන කර්මාන්ත ශාලාව නවීකරණයකර අවසන් කෙරිණි. එමෙන්ම මෙම වසර තුළදී අඹේවෙල කර්මාන්ත ශාලාවේ නවීකරණකටයුතුද සිදුකෙරෙමින් පැවතිණි.

කොළඹ කර්මාන්ත ශාලාව බඩල් ගම නව පරිශ්‍රයකට ගෙනයනු ඇති අතර එහි සැකසුම් ධාරිතාව දිනකට ලීටර 200,000 කි. 2016 මැයි මසදී නව කර්මාන්ත ශාලාව සඳහාමුල් ගල තබන ලදී.

**සැපිරූ ඉලක්ක සහ උපක්‍රම**

2016 වසරේදී, අප කිරිශීතකරණ මධ්‍යස්ථාන 2 ක්ද ගොවි ස්වයංපාලිත සමිති 238 ක්ද පි හි ටවූ අතර දිනකට කිරි ලීටර 200 ක් නිෂ්පාදනය කළහැකි කිරි ගොවිපොළ 23 ක් සහ දිනකට කිරි ලීටර 100 ක් නිෂ්පාදනය කළහැකි කිරි ගොවිපොළ 22 ක් පිහිටුවීමට සහය ලබාදෙන ලදී. මීටඅමතරව, කිරි එකතු කිරීම වැඩිකිරීම සඳහා සමාගම විසින් පහත ක්‍රියාමාර්ගයන් ගන්නා ලද අතර එය වසර තුළදී කිරි එකතු කිරීම 8% කින් වැඩිවීමට මග පෙන්වන ලදී.

- මී දෙනුන් සහ වැස්සියන් 150 ක් රටේ විවිධ ප්‍රදේශවල සිටින ගොවීන්ට බෙදා දීම.
- ගොවියන් සහ ගොවි ස්වයංපාලිත සමිති අතර කිරි කෑන් 1412 ක්, කුඩා ශීතකරණ 15 ක් සහ තණකොළ කපන යන්ත්‍ර 11ක් බෙදාදෙන ලදී.
- කිරි ගොවිපොළ කළමනාකරණය, කිරිදෙනුන්ගෙන් ඵලදායී ලෙස කිරි දෙවීම යනාදිය සම්බන්ධව දැනුම වැඩිදියුණුකිරීම් සඳහා ගොවි පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

වසරේ දළ අලෙවිය රු. මිලියන 7.584 සිට රු. මිලියන 8,679 දක්වා වැඩි වී වසරේ ශුද්ධ ලාභය රු. මිලියන 327 ක් ලෙස වාර්තා විය. වසර අවසානයේදී, අපගේ බෙදාහැරීම් ජාලය තු ළ බෙදාහැරීම් මධ්‍යස්ථාන 132 ක් පැවති අතර ඉන් 21 ක් මේ වසරේදී ස්ථාපිත කළ ඒවා විය.

**අනාගත මෙහෙයුම් පරිසරය**

රජයේ සැලසුම් අනුව අනාගතයේදී ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත වෙනු ඇති අතර රජයට හිමි සමාගමක් ලෙස අපගේ කෙටි කාලීන සහ දීර්ඝ කාලීන සැලසුම්ද ඒ අනුවම සැකසේ.
මෙහෙයුම් පරිසරය ඉදිරියටද තරඟකාරීවනු ඇති අතර කුඩා සහ මධ්‍ය පරිමාණයේ තරඟකරුවන් සමග කටයුතු කිරීමට සිදුවෙනු ඇත.

**ඉදිරි මග**

2016 වසරේ දී සමාගම අමුකිරි ලීටර මිලියන 97 ක් එක් රැස්කිරීමට සහ එකතු කිරීමේ ජාලය පුළුල් කිරීමට අපේක්ෂා කරන ලදී. මෙම ඉලක්කය ලබාගැනීමට සහ කිරිවල ගුණාත්මක බව වැඩිකිරීමට කළමනාකාරීත්වය විසින් ගව කළමනාකරණය තුළ ආයෝජනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. තරඟකරුවන්ට වඩා වැඩි මිලක් එමගින් ගොවියාට ලබාදෙන බැවින් ඔවුන්ගේ ජීවන තත්වය උසස්වෙනු ඇත.

එමෙන්ම 2017 වසරේදී රු. බිලියන 17 ක ආදායමක් ළඟාකර ගැනීම පිණිස යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කළමනාකාරීත්වය අපේක්ෂා කරයි.

මගේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ සංස්ථානික ව්‍යාපාර උපාය මාර්ග සැලසුමක් ක්‍රියාත්මක කිරීම තුළින් මෙම ආයතනය තිරසර ආර්ථික සංවර්ධනය සඳහා දායක කරවීමයි.

මෙමආයතනයදියුණුකිරීමසඳහා රේඛීය අමාත්‍යාංශයේ සහ අමාත්‍යවරයාගේ සහය ඇතිව වටිනා දායකත්වයක් දැක්වූ පෙර අධ්‍යක්ෂ මණ්ඩලයටද ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අපගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය සහ කැපවීම තුළින් ආයතනයේ ශීඝ්‍ර දියුණුව හා ප්‍රගතිය සහිත දීප්තිමත් අනාගතයක් දැකිය හැකි බව මම විශ්වාස කරමි.

..............................................

**ඉංජි. එම්. සුල්ෆිකාර් කාදර්**
සභාපති
2018-06-11

2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයක කාල සීමාව සඳහා මිල්කෝ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කරන ලද මුදල් වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

### ප්‍රධාන කාර්යය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නැවුම් කිරි එකතු කිරීම සහ කිරි නිෂ්පාදන පිරිසැකසුම, ඇසුරුම් කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීමයි.

### දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ සමාගමේ දේපළ, පිරියත හා උපකරණවලට සිදුකරන ලද එකතුකිරීම් රුපියල් මිලියන 143.9 ක් වූ අතර ක්ෂයකිරීමේ ගාස්තු පෙන්වා දී ඇති පරිදි වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

පහත දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩලය 2016.01.01 සිට කටයුතු කරන ලදී.

| | |
|---|---|
| කේ.පී.පී.එච්. මිහිරිපැන්න මහතා | - සභාපති |
| පී.බී. ඒ. සමරකෝන් මහතා | - නියෝජ්‍ය සභාපති |
| ටියුඩර් එස්. අමරසිංහ මහතා | - ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| බියංකා ගමගේ මිය | - අධ්‍යක්ෂ (භාණ්ඩාගාරයේ නියෝජිත) |
| ජේ.ඒ.එස්. ජයකොඩි මහතා | - අධ්‍යක්ෂ |
| එම්.පී. එස් අබේරත්න මහතා | - අධ්‍යක්ෂ |
| ඒ.එම්.ආර්.බී. අලහකෝන් මහතා | - අධ්‍යක්ෂ |
| බී.ඩී.එම්. චන්දිම මහතා | - අධ්‍යක්ෂ |

පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු මෙහි දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වූහ/ පත්වූහ.

එම්.එච්.එම්. ෆසාල් මහතා 2016.02.03 දින සිට සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.

### කොටස් තොරතුරු

සමාලෝචිත වර්ෂය පුරා සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ප්‍රමාණයෙන් සහ අගයෙන් රුපියල් මිලියන 319.4 ක් විය.

### සංචිත

රු. 1,257,791,931/=ක් වූ ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභය, ගිණුම්වල පළමු පිටුවේ දක්වා ඇති බදුවලින් පසුව ප්‍රවර්තන වසරේ ලාභය වූ රු. 408,190,506/=ට ගලපන ලදී.

සංචිතවලට වසර අවසානයේ රුපියල් 25,000,000/- ක ප්‍රාග්ධන සංචිතය සහ රුපියල් 1,689,978/- ක් වූ නිදන් අරමුදල අයත් වේ.

### කොන්ත්‍රාත්වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා

සමාගමේ අධ්‍යක්ෂවරු සමාගමේ කිසිම කොන්ත්‍රාත්තුවකට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වී නොමැත.

### ආයතනික පාලනය

අධ්‍යක්ෂමණ්ඩලය යහපත් ආයතනික පාලනය සහතික කරයි. සමාගමේ අරමුණු මෙන්ම කොටස්කරුවන්ගේ අරමුණු සහ අපේක්ෂාවන් සමග කාර්ය සාධනය අනුකූල වන බව සහතික කිරීම අධ්‍යක්ෂමණ්ඩලයේ වගකීමයි.

**බදුකරණය**

පොළී ආදායමෙන් සහ විලම්භිත බදුවලින් පැන නගින ආදායම් බදු වගකීම රු.12,246,918/= කි. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16 වැනි වගන්තිය යටතේ මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවීමට ඇති සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට නිවැරදිව ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන් සිය උපරිම දැනුම සහ විශ්වාසය අනුව සෑහීමකට පත් වේ.

**අනුකූලතාවය**

ශ්‍රී ලංකාවට හෝ වෙනත් දේශයකට අදාළ වන නීති සහ රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයේ ක්‍රියාකාරකම්වල සමාගම නිරත වී නොමැත.

**අඛණ්ඩ පැවැත්ම**

පූර්වේක්ෂිත අනාගතයේ සිය මෙහෙයුම්අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතු බවට අධ්‍යක්ෂමණ්ඩලය සෑහීමකට පත් වෙයි. ඒ අනුව, සමාගමේ ගිණුම් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය ආදේශ කිරීම අප අඛණ්ඩව සිදු කරන්නෙමු.

**විගණකවරුන් පත්කිරීම**

2016.12.31න් අවසන් වර්ෂය සඳහා සමාගමේ ගිණුම් විගණනය සඳහා විගණකවරුන් ලෙස වරලත් ගණකාධිකාරීන් වන M/S SJMS Associates ආයතනය විගණකාධිපතිවරයා විසින් නම් කරනු ලදුව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂජනරාල්වරයා විසින් පත්කරන ලදී. අධ්‍යක්ෂවරුන් දන්නා දුරට විගණකවරුන්ට සමාගම සමග හෝ එහි පරිපාලිත සමාගම් සමග ඔවුන්ගේ නිදහසට බලපෑමක් විය හැකි කිසිදු සම්බන්ධතාවයක් නොමැත.

**අධ්‍යක්ෂවරුන් සඳහා සහ වෙනුවෙන්**

.................................
සමාගමේ ලේකම්
ෆිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල් ඒජන්සීස් (පුද්) සමාගම
( Sec/555/91), 300/3 නාවල පාර, නාවල

සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට එක් වරක් පදනමින් වාරික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදී. මූල්‍ය පාලනය සහතික කිරීමේදී සහ පවත්වා ගැනීමේදී සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික අයවැය ප්‍රධාන සාධන පත්‍ර වූ අතර මූල්‍ය වර්ෂය ආරම්භයේදී සියලු රේඛීය කළමනාකරුවන් විමසා ඒවා පිළියෙල කරනු ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය.

මාසික කාර්ය සාධන වාර්තා පෙර මාසයේ වාර්තා සමග සංසන්දනය කරනු ලබන අතර තදනන්තර මාසික රැස්වීම්වලදී අයවැය නිතිපතා සභාගත කරන ලදී. මෙම වාර්තාව ඉලක්ක සහිතව මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ කාලීන වාර්තා සපයන අතර සමාගමේ ලාභය සහ අලාභය සම්බන්ධයෙන් සඵල කළමනාකරණ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලබා දෙයි.

## විගණන කමිටුව

භාණ්ඩාගාරය නියෝජනය කරන්නා වූ අධ්‍යක්ෂවරයා විගණන කමිටුවේ මුලසුන දැරිය යුතු අතර කමිටුව තවත් විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සහිතව ක්‍රියාත්මක වූ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස කටයුතු කරන අතර වඩා ඉහළ ස්වාධීනත්වයක් සහතික කිරීම බාහිර ආයතනයකට පිරිනමා ඇති අභ්‍යන්තර විගණනය විසින් එයට සේවය සපයන ලදී.

අර්න්ස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම වර්ෂය තුළදී අභ්‍යන්තර විගණකවරුන් ලෙස කටයුතු කරන ලදී. එම ආයතනය ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල, පොලොන්නරුව හා දිගන යන කර්මාන්තශාලා වල ශාඛා කාර්යාල පවත්වාගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණකවරුන් විසින් පිළියෙල කරනු ලබන විගණන සැලැස්මක් වර්ෂය ආරම්භයේදී විගණන කමිටුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර මෙම සැලැස්ම ප්‍රකාරව වසර පුරාම අභ්‍යන්තර විගණන විමසුම් හා පරීක්ෂාවන් සිදුකරනු ලබයි. විගණන අනාවරණයන් පිළිබඳ විස්තරාත්මක වාර්තා පළමුව අදහස් සහ ප්‍රතිචාර සඳහා අදාළ කළමනාකරුවන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කරනු ලැබේ. මෙම අදහස් මත පදනම්ව, සාරාංශ වාර්තාවක් සකස් කොට විගණන කමිටුවේ සමාලෝචනය සහ පසු විපරම් ක්‍රියා මාර්ග සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුව මසකට වරක් රැස්වේ.

## ආයතනික කළමනාකරණය

තම කොටස්කරුවන්ට සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව සමාගමේ මූල්‍ය තත්ත්වය නියෝජනය වන පරිදි නිසි විගණන වාර්තා සමාගම පවත්වා ගන්නා බවට අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගනී. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ සහ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන බවට සහ ඉදිරිපත් කරනු ලබන බවට ඔවුන් සහතික වෙයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/සී/මිල්කෝ/16/01    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 30 දින

කොටස් හිමියන් වෙත

**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම,**

**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහය වන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**විගණකගේ වගකීම.**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ මතය ව්‍යාවනය **සඳහා** වූ ඡේදයෙහි වැදගත් කරුණු දක්වා තිබුණද ,විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

මතය ව්‍යාවනය සඳහා පදනම
-------------------------------

(අ) ප්‍රාග්ධන ව්‍යාපෘතියක් වූ යෝගට් මිශ්‍ර කිරීමේ පිරියත සඳහා රු.104,177,779 වටිනාකමක් ප්‍රාග්ධන නොනිමි වැඩ ව්‍යාපෘති යටතේ (CWIP) 2016 වර්ෂයේ නොවැම්බර් අවසානය වන තෙක් වාර්තා කර පසුව 2016 දෙසැම්බර් මස ප්‍රාග්ධනිත කර තිබුණි. මෙම යන්ත්‍රය ඉංජිනේරුවරුන් සහතික කල පරිදි වැඩකළ හැකි තත්ත්වයේ පැවති නමුත් වත්කම දීර්ඝ කාලයක් නිෂ්පාදන මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා යොදා නොගෙන අක්‍රියව පැවතිණ. එම නිසා වත්කම වර්තමානයේ ක්‍රියා විරහිත තත්ත්වයේ පවතී.කෙසේ වුවත් ඉහත වත්කම සඳහා වාර්තාවේ දිනට හෝ ඊට පෙර කාලපරිච්ඡේදය සඳහා හානිකරණ පරීක්ෂාවක් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 දෙසැම්බර් 31 දින වන විට එහි අගය කිරීම සම්බන්ධව මා හට සෑහීමකට පත් විය නොහැකි විය.තවද මෙම කරුණ මත පදනම්ව පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විකරණය කරන ලද මතයක් ප්‍රකාශ කරන ලදී.

(ආ) සමාගමේ කර්මාන්තශාලා තුනක් නවීකරණය පිණිස රු.6,189,574,828 ක වටිනාකමක් සහ බඩල්ගම කිරි සැකසුම් පිරියත ස්ථාපිත කිරීම සඳහා රු.4,831,791,167ක වටිනාකමක් පිරිවැය ලෙස යොදවා ඇත.කෙසේ වුවද සමාගමේ වර්තමාන කළමණාකරණ වාර්තා/ලිපිගණුදෙනු සහ කළමණාකරනය සමග සිදුකල විමසුම් මගින් සමාගමේ ඉහළ නංවාගත් ධාරිතාවයට ප්‍රමාණවත් පරිදි කිරි සැපයුමක් නොමැති බව අනාවරණය විය.ඒ අනුව මෙම කරුණ ඉහත සඳහන් ශේෂයන් හානිකරණය වීම සම්බන්ධ ඇඟවීමක් බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36-වත්කම් හානිකරණය අනුව හානිකරණ පරීක්ෂාව සිදු කර නොතිබුණි.මෙම කරුණ පෙර වර්ෂයේ සිට පවතින අතර මෙම කරුණ මත පදනම්ව පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විකරණය කරන ලද මතයක් ප්‍රකාශ කරන ලදී.

(ඇ) සමාගම නඩත්තු කරන වාර්තා අනුව ,ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය (මහා භාණ්ඩාගාරය) කර්මාන්තශාලා තුනක් නවීකරනය සඳහා හා බඩල්ගම නව කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා රු.13,212,970,600 ක ණය අත්තිකාරම් ලබාදී ඇත.ඉහත වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල භාණ්ඩාගාර ණය ලෙස දක්වා ඇත. වාර්තා කරන දින තෙක් මා හට අත්තිකාරම් වටිනාකම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලිඛිත තහවුරුවක් ලැබී නොමැත. මුදල් අමාත්‍යාංශයේ බාහිර සම්පත් වෙබ් අඩවියට අනුව මුදල් අමාත්‍යාංශය සමාගම වෙනුවෙන් රු.10,859,986,560ක් උපයෝජනය කර ඇත.කෙසේ නමුත් රු.2,304,813,243 ක වෙනස සඳහා ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් මා හට නොලැබුණු අතර තවදුරටත් රු.6,832,729,503ක අරමුදල් අත්තිකාරම් ලබාදුන් බඩල්ගම කර්මාන්තශාලාව ඉදිකිරීම් සඳහා ණය ගිවිසුමක් නොමැති විය.එමනිසා ණය නැවත ගෙවීම සඳහා වන කොන්දේසි හා නියමයන් දැනගැනීමට නොහැකි විය.තවදුරටත් මේ සම්බන්ධව ලිඛිත තහවුරුවක් මා හට නොලැබුණි.

(ඈ) ශ්‍රී ලංකා රජය (මහා භාණ්ඩාගාරය) විසින් කර්මාන්තශාලා නවීකරණය සඳහා සමාගමට ණය පිරිනමා ඇත.ගිවිසුම අනුව නියමිත කාලය තුල ගෙවීම් පැහැර හරිනු ලැබුවහොත් සමාගම විසින්

භාණ්ඩාගාරයට සීයයට 2ක පොලියක් ගෙවිය යුතුය.කෙසේ වෙතත්,මේ වනතෙක් කිසිදු නැවත ගෙවීමක් සිදු කර නොමැත. තවද මේ සම්බන්ධව පොළිය උපචිත කර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබිණ.එමගින් වාර්තා කරන දිනය වනවිට සමාගමේ සිය වගකීම ආසන්න වශයෙන් රු.මිලියන 117 කින් අවගණනය වී තිබූ අතර එම වටිනාකමට සමාන ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂයේ ලාභය අධිගණනය වී තිබුණි.

(ඉ) ඉන්වෙන්ට්‍රි යටතේ හානිකරණ පරීක්ෂාවක් හා වෙන්කිරීමක් සිදු කර නොතිබුණු රු.30,890,878 ක් වටිනා චලනය නොවන අයිතම හා රු.35,557,148ක් වටිනා සෙමින් චලනය වන අයිතම නිරීක්ෂණය විය.මේ අතර සමාගම විසින් ඉන්වෙන්ට්‍රි ශේෂයන් සඳහා රු.11,352,785ක් වෙන් කිරීමක් කර ඇති අතර එම වෙන්කිරීම ගණනය කිරීමේ නිරවද්‍යතාවය තහවුරු කිරීම පිණිස විස්තර සපයා නොතිබුණි.

(ඊ) පහත ශේෂයන් සඳහා මා විසින් ඉල්ලන ලද උපයෝගී ලේඛන ලබා දී නොතිබිණ. එබැවින් එවැනි ශේෂවල නිරවද්‍යතාවය සහ වලංගුතාවය සහතික කිරීමට මට නොහැකි විය.

| ගිණුම් විෂයය | ඉදිරිපත් නොකළ සාක්ෂි | වටිනාකම<br>රු. |
|---|---|---|
| ගව ආහාර | විස්තරාත්මක උපලේඛණයන් හා වයස් විශ්ලේෂනයන් | 7,856,860 |
| කිරිභාජන අත්තිකාරම් (Milk Can) | ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛණයන් | 16,114,541 |
| ආපදා ණය (විධායක නොවන) | ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛණයන් | 41,076,727 |
| ආපදා ණය (විධායක) | ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛණයන් | 21,377,987 |
| උපචිත වියදම් | පසුකාලීන ශේෂ පියවීමට අදාල සාක්ෂි | 4,207,457 |
| වෙනත් ණය හිමියෝ | පසුකාලීන ශේෂ පියවීමට අදාල සාක්ෂි | 12,005,844 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | ලබාදුන් නියැදිය සඳහා උපයෝගී ලේඛණ | 21,895,870 |
| එකතුව | | 124,535,286 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(උ) සමාගම වසර ගණනාවක් සඳහා ස්ථාවර වත්කම්වල සම්පූර්ණ සත්‍යාපනයක් සිදු කර නොමැත.එබැවින් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ස්ථාවර වත්කම්වල පැවැත්ම සම්බන්ධව සෑහිමකට පත්විය නොහැකි විය.

**මතය ව්‍යාවනය**

---------------------

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම, විගණනයේ විෂය පථය හා සීමාවන් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මා දරන්නාවූ මතය

- ව්‍යාවනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ජ/ස එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච් එම් ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | සටහන | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 8,679,465,305 | 7,584,727,777 |
| විකුණුම් පිරිවැය | | (7,843,867,888) | (7,011,965,727) |
| **දළ ලාභය** | | 835,597,417 | 572,762,050 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 4 | 264,476,173 | 353,057,479 |
| | | 1,100,073,590 | 925,819,529 |
| පරිපාලන වියදම් | | (533,369,403) | (617,282,945) |
| බෙදාහැරීමේ වියදම් | | (233,496,881) | (201,941,435) |
| වෙනත් වියදම් | 5 | (4,278,759) | (67,777,030) |
| **මෙහෙයුම්වලින් ලාභ** | | 328,928,548 | 38,818,119 |
| මූල්‍ය ආදායම | 6 | 62,078,442 | 73,076,212 |
| මූල්‍ය වියදම | 7 | (51,675,441) | (108,076,590) |
| **බදුවලට පෙර ශුද්ධ ලාභය** | 8 | 339,331,549 | 3,817,741 |
| ආදායම් බදු වියදම් | 9 | (12,246,918) | (16,117,252) |
| **බදුවලින් පසු වසරේ ශුද්ධ ලාභය/(පාඩුව)** | | 327,084,631 | (12,299,511) |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| ලාභයට හෝ පාඩුවට ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන අයිතමය: | | | |
| බදු අඩුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම ප්‍රත්‍යාගණනය | | 81,105,874 | 39,155,812 |
| **බදු අඩු කර වෙනත් මුළු විස්තීර්ණ ආදායම** | | 81,105,874 | 39,155,812 |
| **මුළු විස්තීර්ණ ආදායම** | | 408,190,505 | 26,856,301 |
| කොටසකට මූලික ඉපයීම්/ (පාඩුව) | 10 | 10.24 | (0.39) |

වරහන් තුළ ඇති අගයන් අඩු කිරීම් වේ.

09 පිටුවේ සිට 41 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

| වත්කම් | සටහන | 2016 දෙසැ 31 දිනට රු. | 2016 දෙසැ 31 දිනට රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 11 | 1,460,028,918 | 1,479,986,458 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | 12 | 11,132,551,197 | 6,735,781,479 |
| මූල්‍ය උපකරණ -ක්‍රමක්ෂය වූ පිරිවය | 17 | 413,952,000 | 967,851,460 |
| දීර්ඝ කාලීන අත්තිකාරම් | 13 | 1,757,139,993 | 3,077,925,645 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 14,763,672,108 | 12,261,545,042 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 14 | 849,112,507 | 649,969,734 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 15 | 1,157,290,197 | 911,398,037 |
| ලැබිය යුතු ආදායම් බදු | 16 | 40,063,729 | 21,393,847 |
| කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය උපකරණ | 17 | 555,450,659 | 168,957,435 |
| මුදල් හා මුදල් සමාන දෑ | 18 | 32,075,368 | 33,253,707 |
| **මුළු ජංගම වත්කම්** | | 2,633,992,459 | 1,784,972,760 |
| **මුළු වත්කම්** | | 17,397,664,567 | 14,046,517,802 |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 19 | 319,454,060 | 319,454,060 |
| ප්‍රාග්ධන සංචිතය | 20 | 25,000,000 | 25,000,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 336,454,463 | 336,454,462 |
| නිදන් අරමුදල | 21 | 1,689,978 | 1,689,978 |
| රඳවාගත් ඉපැයුම් | | 1,665,982,437 | 1,257,791,931 |
| **කොටස් හිමියන්ගේ අරමුදල** | | 2,348,580,937 | 1,940,390,431 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විලම්භිත බදු බැරකම් | 22 | 31,663,933 | 28,214,500 |
| පොලී රහිත ණය ගැනීම් | 23 | 2,108,063 | 2,108,063 |
| පොලී සහිත ණය ගැනුම් - දීර්ඝ කාලීන | 23 | 13,500,039,587 | 5,671,067,321 |
| ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයට කළ යුතු ගෙවීම් | 23 | - | 3,799,067,113 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය | 24 | 477,636,427 | 516,891,001 |
| විලම්භිත ආදායම - රජයේ ප්‍රදානය | 25 | 74,511,519 | 60,662,036 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | 14,085,959,529 | 10,078,010,034 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 26 | 698,308,209 | 488,262,509 |
| පොලී සහිත ණය ගැනුම් -කෙටි කාලීන | 23 | 89,806,681 | 1,119,615,137 |
| බැංකු අයිරා | 27 | 175,009,212 | 420,239,691 |
| **මුළු ජංගම බැරකම්** | | 963,124,102 | 2,028,117,337 |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | 17,397,664,567 | 14,046,517,802 |

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීම්ය
09 පිටුවේ සිට 41 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලද බවට සහතික කරමි.

..............................................

**එම්.ජී.පී. [illegible]තිලක මහතා**

**මූල්‍ය කළමනාකරු**

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

2018.06.13 වන දින මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී

....................................  ....................................

**එම්.සුල්ෆිකාර් කාදර් මහතා** — **සහාපති**

**නිහාල් එදිරිසිංහ මහතා** — **ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

| | ප්‍රකාශිත ප්‍රාග්ධන රු. | ප්‍රාග්ධන සංචිතය රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | නිදන් අරමුදල රු. | රඳවාගත් ඉපැයුම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,230,935,630 | 1,913,534,130 |
| වසරේ ශුද්ධ අලාභය | - | - | - | - | (12,299,511) | (12,299,511) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | 39,155,812 | 39,155,812 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 319,454,060 | 25,000,000 | 336,454,462 | 1,689,978 | 1,257,791,931 | 1,940,390,431 |
| වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | 327,084,631 | 327,084,631 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | 81,105,874 | 81,105,874 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 319,454,060 | 25,000,000 | 336,454,463 | 1,689,978 | 1,665,982,437 | 2,348,580,937 |

වරහන් තුළ ඇති අගයන් අඩු කිරීම් වේ.

09 පිටුවේ සිට 41 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016 දෙසැ 31 දිනට | 2015 දෙසැ 31 දිනට |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | රු. | රු. |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 339,331,549 | 3,817,741 |
| පහත දෑ සඳහා ගැලපීම්; | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම | 268,073,500 | 260,027,049 |
| ආයෝජනවලින් ආදායම | (62,078,442) | (73,076,212) |
| බදු අධි වෙන් කිරීම ලාභයට පුනස්ථානය කිරීම | - | (161,291,918) |
| පොළී වියදම | 48,225,450 | 93,512,932 |
| කල්බදු පොළිය | 3,387,156 | 9,267,133 |
| විලම්භිත ප්‍රදාන මත පිළිගත් ආදායම | (21,697,268) | (22,222,444) |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | 2,599,134 | 993,655 |
| විනිමය ලාභය | (14,190,678) | (67,851,169) |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදනය- පාරිතෝෂිකය | 82,436,290 | 79,207,709 |
| නිශ්චල ඉන්වෙන්ට්‍රිය සඳහා ප්‍රතිපාදන | 743,577 | - |
| ඉවත් කළ භාණ්ඩ කපාහැරීම | - | 2,676,936 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | 646,830,267 | 125,061,413 |
| ඉන්වෙන්ට්‍රිවල (වැඩිවීම)/අඩුවීම | (199,886,350) | 1,896,150 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම | (245,501,545) | 296,064,588 |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම | 210,045,700 | (259,749,770) |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | 411,488,073 | 163,272,380 |
| ගෙවූ පොළිය | (48,225,450) | (93,512,932) |
| ගෙවූ බදු - ආර්ථික සේවා ගාස්තු සහ ආදායම් බද්ද | (39,468,879) | (23,251,674) |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල ගෙවීම- පාරිතෝෂිකය | (31,573,226) | (20,374,268) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 292,220,518 | 26,133,506 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කර ගැනීම | (235,075,959) | (63,676,962) |
| ඉදිකිරීම් කාර්යයන්හිදී දේපළ, පිරියත හා උපකරණවල ආයෝජන | (3,072,931,068) | (1,265,330,811) |
| ගෙවන ලද දීර්ඝ කාලීන අත්තිකාරම් | - | (3,077,925,645) |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ණය | - | 4,345,757,033 |
| ලැබූ පොළිය | 62,078,442 | 73,076,212 |
| ආපසු ගැනීම/(නව) කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ආයෝජන (ශුද්ධ) | 181,596,914 | 211,084,360 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/ (භාවිතා කළ)** | (3,064,331,670) | 222,984,187 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| ලැබූ රජයේ ප්‍රදාන | 35,546,751 | 3,017,633 |
| ගෙවූ බදු කුලිය | (21,648,426) | (48,707,299) |
| වසර තුළ ප්‍රදානය කළ ණය | 3,082,050,144 | - |
| ණය සහ ණයගැනුම් ආපසු ගෙවීම | (79,785,177) | (78,628,337) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/ (භාවිතා කළ)** | 3,016,163,292 | (124,318,003) |
| **මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම** | 244,052,139 | 124,799,690 |
| **වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන අ )** | (386,985,984) | (511,785,674) |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන ආ)** | (142,933,845) | (386,985,984) |

| | 2016 දෙසැම්බර් 31 දිනට 2016 රු. | 2015 දෙසැම්බර් 31 දිනට 2015 රු. |
|---|---|---|
| **වසර ආරම්භයේදී** | | |
| බැංකුවල ශේෂයන් | 27,273,015 | 22,813,784 |
| අතැති සුළු මුදල් | 5,980,692 | 3,798,143 |
| | 33,253,707 | 26,611,927 |
| බැංකු අයිරා | (420,239,691) | (538,397,601) |
| | (386,985,984) | (511,785,674) |
| **වසර අවසානයේදී** | | |
| බැංකුවල ශේෂයන් | 31,668,018 | 27,273,015 |
| අතැති සුළු මුදල් | 407,350 | 5,980,692 |
| | 32,075,368 | 33,253,707 |
| බැංකු අයිරා | (175,009,212) | (420,239,691) |
| | (142,933,845) | (386,985,984) |

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

09 පිටුවේ සිට 41 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

**1.1 ආයතනික තොරතුරු**

**1.1.1 නෛතික සහ නිත්‍යවාස ස්වභාවය**

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම (සමාගම) යනු ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ එහි නිත්‍ය වාසය සහිත සීමිතබැඳීම් සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මාන්ත (පුද්) සමාගම" ලෙස මෙම සමාගම 1996 මැයි 09 දින සංස්ථාගත කර ඇත. සමාගමේ නම " සීමාසහිත මිල්කෝ (පුද්) සමාගම" ලෙස 2001 ජූලි 23 වන දින වෙනස් කරනු ලැබීය. ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව, සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගමට 1998 පෙබරවාරි 3 දින වන විට අයත් වූ සහ එම සමාගම භාවිතා කළ (ඉඩම් හැර) සියලු දේපළ, පිරියත හා උපකරණවල අයිතිය සහ සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන (පුද්) සමාගම විසින් එම දිනය වන විට භාවිතා කළ ඉඩම් සහ ගොඩනැගිලිවල බදු අයිතිය, 1998 පෙබරවාරි 04 වන දින සිට සමාගම වෙත මාරුකර තිබේ. එසේ මාරු කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම රු 306,500,020 කි. තවද, 2000 අගෝස්තු 08 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැගිලිවල වාර්ෂික කල්බදු කුලිය වන රු. 20,427,900/- ක මුදල, ඒකාබද්ධ ව්‍යාපාරය බවට පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අත් හැර දමා ඇත. බද්ධ ව්‍යාපාර ගිවිසුම තවදුරටත් බලාත්මක නොවුව ද එකී රජයේ ඉඩම හා ගොඩනැගිලිවලට අදාළ ගිණුම්වල උචිත ගැලපීම් සමාගම සිදුකර නොමැත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 45, නාවලපාර, කොළඹ 05 යන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල පිහිටා ඇත.

**1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය**

වර්ෂය තුළ දී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසිරීම, බෙදාහැරීම හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමයි.

**1.1.3 නිකුත් කිරීමට බලය පැවරූ දිනය**

2018 මැයි මස 2 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක් ප්‍රකාරව 2016 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය පවරන ලදී.

**1.1.4 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම "අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය" යන කොටසෙහි දැක්වේ.

**1.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

**1.2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.2.1.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS / LKAS)අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

**1.2.1.2 ගිණුම් පදනම**

සාධාරණ අගය අනුව ගණන් බැලූ ඇතැම් වත්කම් සහ වගකීම් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකස් කර ඇත.

**1.2.1.3 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල**

අදාළ අස්ථිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මනිනු ලැබේ. (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල) සමාගමේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

**1.2.1.4 අනුකූලතා ප්‍රකාශය**

2016 දෙසැම්බර් 31 දිනට සමාගමෙහි මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහසමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත්කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

**1.2.1.5 අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්ම සඳහා සමාගමට ඇති හැකියාව පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමක් සිදු කරනු ලදුව, පූර්වාපේක්ෂිත අනාගතය තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවශ්‍ය සම්පත් සමාගම සතු බවට සෑහීමට පත්විය. තව ද, සමාගමට අඛණ්ඩ පැවැත්මකට ඇති හැකියාව ගැන සැලකිය යුතු සැකයක් ඇතිකරන අවිනිශ්චිතතාවක් කළමනාකාරිත්වයට දැනැගන්නට නැත. එබැවින්, "අඛණ්ඩ පැවැත්ම" පදනම් කොට ගෙන මූල්‍ය ප්‍රකාශ තවදුරටත් සකස් කරනු ලැබේ.

**1.2.1.6 සංසන්දනාත්මක තොරතුරු**

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇති අතර ඒවා පෙර වසරේ යොදාගත් ප්‍රතිපත්ති සමග අනුරූප වේ. අවශ්‍ය තන්හි ඉකුත් වසරේ සංඛ්‍යා සහ පාඨ වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට ගැලපෙන පරිදි යළි සකසා ඇත.

**1.2.1.7 විදේශීය මුදල් ගනුදෙනු**

සියලු විදේශ විනිමය ගනුදෙනු, ගනුදෙනු කළ දිනයන්ට අදාළ විනිමය අනුපාතයෙන් වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදලින් අගයදක්වාඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන මුදලට පරිවර්තනය කරනු ලබන අතර එහි ප්‍රතිඵල වශයෙන් සිදුවන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

මුදල්මය නොවන වත්කම් සහ බැරකම්, වටිනාකම් නිශ්චය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ .එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ සඳහා හේතු අනෙකුත් විස්තීර්ණ ආදායමේ ගිණුම් ගත කොට ඇත.

**1.2.1.8 ද්‍රව්‍යමයභාවය සහ සමූහනය**

සමාන අයිතම අයත් වන එක් එක් ද්‍රව්‍යමය පන්ති මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දක්වා ඇත. ස්වභාවයෙන් හෝ කර්තව්‍යයන් අසමාන අයිතම, ඒවා ද්‍රව්‍යමය නොවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

**1.2.1.9 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්**

**අ) විනිශ්චයන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමේ ක්‍රියාදාමයේදී, මූල්‍ය ප්‍රකාශවල පිළිගත් ප්‍රමාණ කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑම් ඇතිකරන ඇස්තමේන්තු කිරීම් සම්බන්ධ ඒවා හැරුණු විට, කළමනාකාරිත්වය විනිශ්චයන් සිදු කොට ඇත.

**ආ) ඇස්තමේන්තු සහ උපකල්පන**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදි, වාර්තා කොට ඇති ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් ප්‍රමාණ සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන්නා වූ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරිත්වය සිදුකිරීම අවශ්‍ය වේ.

මීළඟ මුදල් වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත, මූල්‍ය තත්වයේ දිනට ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනාගතය සහ අනෙකුත් වැදගත් මූලාශ්‍රවලට අදාල වැදගත් උපකල්පන සැලකිල්ලට ලක් කර තිබේ.

**1.3 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම**

**1.3.1 දේපළ, පිරියත හා උපකරණ**

**අ) මැනුම**
සියලු දේපළ, පිරියත සහ උපකරණ ආරම්භයේදී පිරිවැය අනුව වාර්තා කරනු ලැබේ. අනතුරුව දේපළ, පිරියත සහ උපකරණ අයතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එබඳු වත්කම් අයත්වන සම්පූර්ණ අයිතම පන්තිය ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

එදිනෙදා අළුත්වැඩියාවන් බැහැර කොට, දේපළ, පිරියත හා උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ සමුච්චිත හානි අඩු කළ පිරිවැයටය. පිළිගැනීමට අවශ්‍ය නිර්ණායක සපුරා තිබේ නම් එම පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අවස්ථාවේදී දරන්නට සිදුවන පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන්නේ නම්, සමාගම එබඳු කොටස්, විශේෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත තනි තනි වත්කම් සේ සලකා ඒ අනුව එම අයිතම ක්ෂය කරනු ඇත.

ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරනු ලබන විට, පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම්, එහි පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිස්ථාපනයක් ලෙස ධාරණ අගය තුළ පිළිගනු ලබනු ඇත. අනෙක් සියලු අළුත්වැඩියාවන් සහ නඩත්තු පිරිවැය, එම පිරිවැය දරනු ලැබූ අවස්ථාවේ ලාභ හෝ අලාභවල හඳුනාගනු ඇත.

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක්බැහැර කිරීම මත හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස) වේ නම් එය වත්කම පිළිගැනීම අත්හිටවූ වර්ෂයේ විස්තීරණ ගිණුම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

**ආ) දේපළ, පිරියත හා උපකරණවල ඵලදායීආයුකාලය**
සෑම වාර්තාකරණ දිනකටම වත්කමක ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සමාගම විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම අගයන්, අනුපාත සහ ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී වෘත්තීය විශේෂඥයන්ගේ මතය අනුව කළමනාකාරිත්වය එළඹි විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**ඇ) ක්ෂයවීම**
දේපළ, පිරියත සහ උපකරණයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත **ඵලදායීආයුකාලය**පුරා සරල රේඛීය පදනම මතලාභයේ හෝ පාඩුවේ ක්ෂයවීම හඳුනා ගනු ලබන අතර එසේ කරනුයේ වත්කමෙහි අන්තර්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව, එම ක්‍රමය ඉතා සමීපව පිළිඹිබු කරන නිසාය.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාල සීමාව හෝ එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය යන කාල දෙකින් අඩු කාලය මතය.

ආර්ථික වශයෙන් ප්‍රයෝජ්‍ය ඵලදායී ජීවිත කාල පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 04 සිට 15 |
| ලී බඩු සහ සවිකිරීම් | වසර 03 සිට 05 |
| විද්‍යාගාර උපකරණ | වසර 03 සිට 05 |
| මෝටර් වාහන | වසර 08 සිට 15 |
| මෙවලම් හා උපකරණ | වසර 03 සිට 10 |
| කාර්යාලීය උපකරණ | වසර 2.5 සිට 05 |
| බෝතල් හා ඇසුරුම් භාජන | වසර 04 |
| පරිගණක | වසර 02 සිට 04 |
| බෝතල් ශීතකරණ | වසර 2.5 සිට 05 |
| මෘදුකාංග | වසර 03 |
| කිරි භාජන | වසර 05 |

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය.

**ඇ) ප්‍රතිසංස්ථාපන පිරිවැය**
මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරූ වැය, එලෙස දැරූ විටදී වියමදක් ලෙස පිළිගනු ලැබේ.

**ඉ) ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම**
දේපළ, පිරියත සහ උපකරණ, අපහරණයේදී හෝ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.වත්කම පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙසය. .

## 1.3.2 කල්බදු

**(අ) මූල්‍ය කල්බදු - සමාගම කල්බදුකරු වන විට**
හිමිකාරිත්වයට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරනුකූලව පවරනු ලැබූ විටදී ඒවා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූල්‍ය කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිතඅපහායන අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දැට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාල සීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය ප්‍රාග්ධන ගත කරනු ලබන අතර කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකින් වඩා කෙටි කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ අගය මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්බිත කර ක්‍රමක්ෂයකරනු ලැබේ.

**ආ) මෙහෙයුම් කල්බදු**
කල්බදු කාලය යටතේ වත්කමක සියලු අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු හිමිකරු විසින්සැබවින්ම දරන විටදී, එම කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන කල්බදු ගෙවීම් ( රක්ෂණ සහ නඩත්තු වැනි සේවා පිරිවැය හැර) සරල මාර්ගික පදනමක් මත කල්බදු කාලය පුරා ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස පෙන්වා ඇත.

## 1.3.3 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ දිනයකදීම කිසියම් වත්කමක් අපහායනය වීමේ ඇඟවීමක් ඇත්දැයි නිශ්චිතව දැන ගැනීම සඳහා සමාගම විසින් ඇස්මේන්තු කරනු ලැබේ. එවැනි අපහායන ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවන් අවශ්‍ය විට සමාගම වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ආපසු අයකර ගත හැකි අගය යනු වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්. අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම අපහායනය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ.භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්කමට විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම්වල අපහායන පාඩු, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් අපහායන අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. මණ්ඩලය විසින් වත්කමේ එවැනි නිරීක්ෂණයක් ඇත්නම් ආපසු එය අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

කලින් හඳුනාගත් අපහායන අලාභයක් ප්‍රතිවර්ත කරනුයේ අවසන් අපහායන අලාභය හඳුනාගනු ලැබූ අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය නිර්ණය කිරීම සඳහා භාවිතාකළ ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්නම් පමණි. එසේ සිදුව ඇති විටදී, වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය දක්වා ඉහළ නංවනු ලැබේ. ඉහළ නංවනු ලැබූ අගය, පෙර වසරවලදී වත්කම සඳහා අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති නම්, ක්ෂයවීම අඩුකොට නිර්ණය කරනු ලැබීමට ඉඩ තිබූ ධාරණ අගය "ඉක්මවා යාමට" නොහැක. එබඳු ප්‍රත්‍යාවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**1.3.4 නොනිමි ප්‍රාග්ධන වැඩ**

වත්කම ප්‍රථම වරට උපයෝජනයට යොදවන විට, දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

**1.3.5 මූල්‍ය වත්කම්**

පහත සඳහන් කාණ්ඩවලට සමාගම තම වත්කම් වර්ග කරනු ලබයි; ඒවා නම් ලාභය හා අලාභය මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීමට ඇති සහ කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය වත්කම් වේ. මූල්‍ය වත්කම් අත්කර ගනු ලැබූ කාර්යය මත වර්ගීකරණය රඳා පවතී. මූලික පිළිගැනීම මත සිය මූල්‍ය වත්කම්වල වර්ගීකරණය කළමනාකාරිත්වය තීරණය කරන අතර, මෙම වර්ග නාමය සෑම වාර්තාකරණ දිනකදීම නැවත ඇගයීමට පාත්‍ර කරයි.

**1.3.5.1 මූලික හඳුනාගැනීම සහ මිණුම්කරණය**

මූලික හඳුනා ගැනීමේදී සමාගම තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කරයි. ආරම්භයේදී සියලු මූල්‍ය වත්කම් සාධාරණ අගය සමග හඳුනාගනු ලැබේ. සාධාරණ අගය රහිත වත්කම් සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය සහ ලාභ අලාභ අනුව හඳුනාගනු ලැබේ.

වෙළඳපොළ සම්ප්‍රදාය සහ නියෝග මගින් නියමිත කාලරාමුවක් තුළ භාරදිය යුතු මූල්‍ය වත්කම් මිලට ගෙන හෝ විකුණා ඇත්නම් ඒවා විකිණීම හෝ මිලට ගැනීම සිදුවූ දිනයේදී හඳුනාගනු ඇත. එනම් වත්කම මිලට ගැනීමට හෝ විකිණීමට සමාගම එකඟ වූ දිනයයි.

මුදල්, ස්ථිර තැන්පතු සහ වෙළඳාමෙහි සහ වෙනත් ලැබිය යුතු දේවල ආයෝජන සමාගමේ මූල්‍ය වත්කම්වලට අයත් වේ.

**1.3.5.2 පසුගණන මිනුම්කරණය**

මූල්‍ය වත්කම්වල පසු ගණන මිනුම්කරණය එම වත්කම්වල වර්ගීකරණය මත පහත සඳහන් අයුරින් සිදුවේ.

**(අ) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්වලට විකිණීම සඳහා තබාගත් මූල්‍ය වත්කම් සහ ලාභ, අලාභ මගින් ආරම්භයේදී සාධාරණ අගය මත හඳුනාගත් මූල්‍ය වත්කම්, ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට මුලින්ම හඳානාගැනීම මත නිමිති කළ මූල්‍ය වත්කම් අයත් වේ. විකිණීම සඳහා හෝ නුදුරු අනාගතයේදී නැවත මිලට ගැනීම සඳහා ලබාගත් මූල්‍ය වත්කම් විකිණීමට තබාගත් මූල්‍ය වත්කම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රිය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ.මූලික පිළිගැනීමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් අපහායන අලාභ අඩුකොට සඵල පොළී ක්‍රමවේදය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබනුයේ අත්පත් කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලන කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය

විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. අපහායනයෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

**(ඇ) කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන**
ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් සමාගමට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් ඇති විටදී ඒවාකල් පිරීම දක්වා රඳවා ගැනීමසේ වර්ගීකරණය කරනු ලැබේ .මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවාගනු ලැබූ ආයෝජන හානි අඩුකොට සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබනුයේ අත්පත් කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ අනුකලන කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. අපහායනයෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

**(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**
විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනවලට ස්කන්ධ සහ සහ ණය සුරකුම් ඇතුළත්ය. විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කර ඇති ස්කන්ධ ආයෝජන වනුයේ විකුණුම සඳහා වර්ගීකරණය කර නොමැති හෝ ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට නිමිති කොට නොමැති ඒවාය. මෙම කාණ්ඩයේ ණය සුරැකුම්පත් වනුයේ අවිනිශ්චිත කාලයක් සඳහා රඳවා ගැනීමට අදහස් කරන සහ ද්‍රවශීලතා අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපොළ තත්වයන්හි වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් විකිණීමට ඉඩ ඇති සුරැකුම්පත් වේ.

මූලික මිනුම්කරණයෙන් පසු. විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන තදනන්තරව සාධාරණ අගයට මනිනු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ, විකිණීම සඳහා පවතින ස්කන්ධ(වෙනත් විස්තීරණ ආදායම) යටතේ හඳුනා ගැනේ. ආයෝජනය බැහැර කරනු ලැබීමේදී, ස්කන්ධ යටතේ ඊට අදාළව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේදී 'වෙනත් මෙහෙයුම් ආදායම' යටතේ හඳුනා ගනී. සමාගම විසින් සමාන සුරැකුම්වලින් එක් ආයොජනයකට වඩා දරණ අවස්ථාවන්හිදී, ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කරන පදනම යටතේ විකිණීමට නියමිතය. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන මඟින් උපයනු ලබන පොලී ආදායම, සඵල පොලී අනුපාතය මත ගණනය කර පොලී ආදායම යටතේ ප්‍රකාශ කරන අතර ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ආදායම් ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම' යටතේ හඳුනාගනී. එවැනි ආයෝජන අපහායනය මත වන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ 'මූල්‍ය ආයෝජන මත අපහායන අලාභවල' හඳුනාගන්නා අතර විකිණීම සඳහ පවතින සංචිතයෙන් ඉවත් කරනු ලැබේ.

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් කෙටි කාලිනව විකිණීමට ඇති හැකියාව සහ අභිලාෂය තවදුරටත් යෝග්‍ය ද යන්න විමසීම පිණිස සමාගම විකිණීමට ඇති සිය මූල්‍ය වත්කම්වල ඇගයීමක් සිදු කරයි. අක්‍රීය වෙළඳපොළ නිසා මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන කළ සහ විකිණීමට කළමනාකාරිත්වයෙහි අභිප්‍රාය පූර්වේක්ෂිත අනාගතය තුළ වෙනස් වන කළ, දුර්ලභ අවස්ථානුගත තත්වයන් තුළ සමාගම මෙම මූල්‍ය වත්කම් නැවැත වර්ගීකරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දේවල නිර්වචනයට යෝග්‍ය වන කළ සහ කල්පිරීම දක්වා මෙම වත්කම් පූර්වේක්ෂිත අනාගතය තුළ තබා ගැනීමට අභිලාශය සහ හැකියාව සමාගමට ඇති කළ, ණය සහ ලැබිය යුතු දැ හැටියට නැවත වර්ග කිරීම, සමාගමට එම වත්කම එලෙස තබා ගැනීමට අභිලාශය සහ හැකියාව ඇත්නම් පමණක් සිදු කළ හැක.

විකිණීම සඳහා ප්‍රතිවර්ගීකරණයට භාජන කිරීමෙන් පසු පවතින මූල්‍ය වත්කමක් සඳහා, ස්කන්ධවල හඳුනාගත් එම වත්කමට පෙරාතුව ලැබුණ පාඩුවක් හෝ ලාභයක් වේ නම්, එය සඵල පොළී අනුපාතය භාවිතා කොට ආයොජනයේ ඉතිරි ආයු කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර වෙනස ද, වත්කමෙහි ඉතිරි ආයු කාලය සඳහා සඵල පොළී අනුපාතය උපයෝගී කොට ගෙන ක්‍රමක්ෂය කරනු ලැබේ. අනතුරුව වත්කම අපහරණය වූ බව නිර්ණය වේ නම්, ස්කන්ධවල වාර්තා වූ ප්‍රමාණය ප්‍රතිවර්ගීකරණය කොට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

**1.3.5.3 ශේෂ පත්‍රයෙන් ඉවත්කිරීම**

අ) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වූ විට, හෝ

ආ) සමාගම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය පවරා ඇති අවස්ථාවක හෝ ලැබුණු මුදල් ප්‍රවාහ කිසිදු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයකට ගෙවීම "හරහා ගමන් කිරීමේ" වැඩපිළිවෙලක් තුළ බැඳීමක් ලෙස බාර ගෙන විට, සහ

වත්කමෙහි සියලු අවදානම් ප්‍රතිඵල සහ පරිදානයන් සමාගම විසින් මාරුකර තිබී හෝ වත්කමෙහි සියලු අවදානම් සහ පරිදාන සමාගම පවරා ඇති විට හෝ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සමාගම සාරානුකූලව පවරා හෝ රඳවා ගෙන නොමැති විට

මූල්‍ය වත්කමක් (හෝ අදාළ තන්හි මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයකින් කොටසක්) ශේෂපත්‍රයෙන් ඉවත් කිරීම සිදුවේ.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය සමාගම පවරා හෝ 'හරහා ගමන් කිරීමේ' වැඩපිළිවෙලකට එළඹ ඇති විටදී සහ වත්කමේ සියලු අවදානම් සහ පරිදාන සාරනුකූලව පවරා හෝ රඳවා ගෙන හෝ එහි පාලනය පවරා නොමැති විටදී, සමාගම වත්කමේ අඛණ්ඩව සම්බන්ධව සිටින ප්‍රමාණයට වත්කම පිළිගනු ලැබේ.

සමාගම ආශ්‍රිත වගකීමක් ද පිළිගන්නා අවස්ථාවකදී, සමාගම රඳවා ගෙන සිටින අයිතිවාසිකම් සහ බැඳීම් නිරූපණය වන පදනමකින් පැවරූ වත්කම සහ සහ ආශ්‍රිත වගකීම මණිනු ලැබේ.

පවරන ලද වත්කම පිළිබඳව ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ සම්බන්ධය, වත්කමේ මුල් ධාරණ වටිනාකමෙන් සහ සමාගම ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම ප්‍රමාණයෙන් වඩා අඩු දෙයට මණිනු ලැබේ.

### 1.3.5.4 මූල්‍ය වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන්හි (අපහායන සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය හෝ සිද්ධි මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මැනිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි. ණය හිමියෝ හෝ ණය හිමියන් සමූහයක් සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම් හා සහසම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්වයන් බඳු ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිණිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැක.

**ක්‍රමක්ෂය පිරිවැයට දැක්වෙන මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන මූල්‍ය වත්කම් සඳහා, කේවල වශයෙන් වැදගත් වන්නාවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් කේවල වශයෙන් පවතින්නේ ද හෝ කේවල වශයෙන් වැදගත් නොවන්නා වූ මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හානිවීම් පිළිබඳ සාක්ෂි පවතී ද නිර්ණය කිරීම සඳහා සමාගම පළමුව ඇගයීමක් සිදු කරයි. වැදගත් වුවත් නොවුවත්, කේවලව අගයනු ලැබූ මූල්‍ය වත්කමක් සඳහා හානිවීමේ වාස්තවික සාක්ෂි නොපවතින බව සමාගම නිර්ණය කරනු ලැබුවහොත්, එම වත්කම සමාන ණය අවදානම් ගතිලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමක ඇතුලත් කරන අතර හානිවීම් සඳහා සාමූහිකව ඇගයීමට ලක් කරනු ලැබේ. හානිවීම් සඳහා කේවලව අගයනු ලබන වත්කම් සහ අපහායන අලාභයක් හඳුනාගනු ලබන/ අඛණ්ඩව පවතින වත්කම් සාමූහික හානිවීම් ඇගයීමෙහි ඇතුලත් කරනු නොලැබේ.

අපහායන අලාභයක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, අලාභයේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදලසහ අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ, මූල්‍ය වත්කමේ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. යම් ණයක විචල්‍ය ණය අනුපාතයක් තිබේනම්, කිසියම් හානි අලාභ මැණීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වර්තමානයේ ක්‍රියාත්මක පොළී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් අඩුකරනු ලබන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අඩු කරන ලද ධාරණ අගය මත අඛණ්ඩව පොළී උපචිත වන අතර අපහායන අලාභය මැණීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් උපචය කරනු ලැබේ. පොළී ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේදී ආපසු අයකර ගැනීමේ යථාර්තවාදී බලාපොරොත්තුවක් නොමැති විට සහ සියලු ඇප උපලබ්ධි වී ඇති විට හෝ සමාගමට පවරනු ලැබ ඇති විට ණය සහ ආශ්‍රිත දීමනා ලියා හරිනු ලැබේ. තදනන්තර වර්ෂයකදී, අපහායනය හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක් නිසා ඇස්තමේන්තුගත අපහායන අලාභයේ ප්‍රමාණය වැඩිවුවහොත් හෝ අඩුවුවහොත්, දීමනා ගිණුම ගැලපීම මගින් කලින් පිළිගත් අපහායන අලාභය වැඩිකරනු හෝ අඩුකරනු ලැබේ. අනාගත ලියා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, එම අයකර ගැනීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

**විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්**
විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සඳහා, ආයෝජනයක් හෝ ආයෝජන කාණ්ඩයක් හානිවී ඇත්දැයි යන්න පිළිබඳව වාස්තවික සාක්ෂි තිබේදැයි ස්ථිරව දැන ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගම ඇගයීමක් සිදු කරයි. ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩුවෙන් සැලකිය යුතු ලෙස හෝ දීර්ඝ කාලීනව අඩුවීම විකිණීම සඳහා ඇති ස්කන්ධ ආයොජන සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂියක් වේ. 'සැලකිය යුතු' යන්න ආයෝජනයේ මුල් පිරිවැයට සාපේක්ෂව අගයනු ලබන අතර, 'දීර්ඝ කාලීනව' යන්න සාධාරණ වටිනාකම එහි මුල් පිරිවැයට පහළින් තිබූ කාලයට සාපේක්ෂව අගයනු ලැබේ. හානිවීම පිළිබඳ සාක්ෂි ඇති විටදී, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කළින් හඳුනාගත් එම ආයෝජනයේ යම් අපහායන අලාභ අඩුකොට, අත්කර ගැනීමේ පිරිවැය සහ වත්මන් සාධාරණ වටිනාකම ලෙස මණිනු ලැබූ සමුච්චිත පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායමෙන් ඉවත් කරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලබයි.

විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කොට ඇති ණය සාධනපත්‍ර ගත් විට, ක්‍රමක්ෂිත පිරිවැයට දක්වනු ලැබූ මූල්‍ය වත්කම් සඳහා යොදාගනු ලැබූ නිර්ණායකම මත පදනම්ව හානි අගයනු ලැබේ. කෙසේවෙතත්, අපහායනය සඳහා වාර්තා කරනු ලැබූ ප්‍රමාණය යනු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කළින් හඳුනාගනු ලැබූ එම ආයෝජනයේ කිසියම් අපහායන අලාභයක් අඩු කොට ක්‍රමක්ෂිත පිරිවැය සහ වත්මන් සාධාරණ අගය අතර වෙනස ලෙස මණිනු ලැබේ.

අපහායන අලාභය මැනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමේ අඩුකරන ලැබූ ධාරණ වටිනාකම මත පදනම්ව, අනාගත පොළී ආදායම අඛණ්ඩව උපචිත වනු ඇත. පොළී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස සටහන් කරනු ලැබේ. තදනන්තර වර්ෂයකදී, ණය සාධන පත්‍රයක සාධාරණ වටිනාකම වැඩිවුවහොත් සහ එම වැඩිවීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභය හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමකට වාස්තවිකව සම්බන්ධයක් ඇත්තේ නම්, විස්තීරණ ආදායම් ප්‍රකාශය හරහා අපහායන අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

**1.3.6 මූල්‍ය වගකීම්**
සමාගම සිය මූල්‍ය වගකීම්, උචිත පරිදි, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් ලෙස හෝ අනෙකුත් මූල්‍යවගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වාර්තාකරණ දිනයට, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් නොතිබුණි.

**1.3.6.1 මූලික පිළිගැනීම සහ මිනුම්කරණය**
සියලූ මූල්‍ය වගකීම් ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලැබේ. ඍජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැය මීට අයත් වේ. සමාගමේ මූල්‍ය වගකීම්වලට ණය සහ ණය ගැනුම්, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් සහ බැංකු අයිරා අයත් වේ.

**1.3.6.2 පසුගණන මිනුම්කරණය**
මූල්‍ය වගකිම්වල පසුගණන මිනුම එම වත්කම්වල වර්ගීකරණය මත පහත සඳහන් අයුරින් සිදුවේ.

**(අ) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්**
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම්වලට විකිණීම සඳහා තබාගත් මූල්‍ය වගකීම් සහ ලාභ, අලාභ මගින් ආරම්භයේදී සාධාරණ අගය මත හඳුනාගත් මූල්‍ය වගකීම්, ලාභ හා අලාභ මගින් සාධාරණ අගයට මුලින්ම හඳානාගැනීම මත නිමිති කළ මූල්‍ය වගකීම් අයත් වේ. විකිණීම සඳහා හෝ නුදුරු අනාගතයේදී නැවත මිලට ගැනීම සඳහා අත්පත් කරගත් මූල්‍ය වගකීම් විකිණීමට තබාගත් මූල්‍ය වගකීම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ.

**(ආ) අනෙකුත් මූල්‍ය වගකීම්**
මූලික පිළිගැනීමෙන් පසුව, අනෙකුත් මූල්‍ය වගකිම් සඵල පොළී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට තදනන්තරව මනිනු ලැබේ. වගකීම් පිළිගැනීම බැහැර කළ විට මෙන්ම සඵළ පොළී අනුපාත ක්‍රමවේද ක්‍රමක්ෂය ක්‍රියාදාමය හරහා ද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ පිළිගනු ලැබේ. අත්කර ගැනීම යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලන කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙන් ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලැබේ.

**1.3.6.3 ශේෂපත්‍රයෙන් ඉවත් කිරීම**

වගකීම යටතේ වූ බැඳීම ඉටුකළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත්වූ විට මූල්‍ය වගකීමේ ශේෂපත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක්, සාරානුකූලව වෙනස් කොන්දේසි යටතේ එම ණය දෙන්නාගේම වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය කරනු ලබන විට හෝ පවතින මූල්‍ය වගකීමක් ක්‍රමානුකූලව වෙනස් කරනු ලබන විට, එවැනි හුවමාරු කිරීමක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම ඉවත් කිරීමක් හා නව වගකීම පිළිගැනීමක් සේ සලකනු ලබන අතර ධාරණ වටිනාකම්වල අදාළ වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**1.3.6.4 මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම**

හඳුනාගත් ප්‍රමාණයන් හිලව් කිරීමට වත්මනෙහි බලාත්මක කළ හැකි නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනමක් මත බේරුම් කිරීමට අභිප්‍රායක් හෝ වත්කම් ලබා ගැනීමට සහ එකවර වගකීම් බේරුම් කිරීමට අභිප්‍රායක් ඇත්නම් පමණක්ම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කොට ශුද්ධ ප්‍රමාණය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

**1.3.7 තොග**

යල්පැන ඇති සහ සෙමින් විකිණෙන  අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට තොග මනිනු ලැබේ.  ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය  ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට තොග විකිණිය හැකි මිලය.

තොග ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අමු ද්‍රව්‍ය | - | බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට |
| නිමි භාණ්ඩ | - | ඍජු ද්‍රව්‍ය, ඍජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවයේ ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයමත තීරණය කළ උචිත සමානුපාතයකට |
| නොනිමි වැඩ | - | යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැයට |
| ඇසුරුම් ද්‍රව්‍ය | - | බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට |
| වෙනත් තොග | - | බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට |
| මාර්ගස්ථ භාණ්ඩ | - | සත්‍ය පිරිවැයට |

**1.3.8 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්**

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

අනෙකුත් ලැබිය යුතු දෑ, අපහායනය සඳහා වන ප්‍රතිපාදන අඩු කොට ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ට හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදන ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. කෙසේවුවද, සමාගමට අදාළ නොවැළැක්විය හැකි හේතු නිසා කාර්යමණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන්නේ නැත.

**1.3.9 මුදල් හා මුදල් හා සමාන දෑ**

මුදල් හා මුදල් හා සමාන දේ වලට  අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස රඳවාගෙන ඇති තැන්පතු ,මුලින් මාස තුනක කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ. බැංකු අයිරා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් තුළ පෙන්නුම් කරනු ලැබේ.

**1.3.10 ප්‍රකාශිත ප්‍රාග්ධනය**

**(අ) වර්ගීකරණය**

මුදල් හෝ අනෙකුත් වත්කම් පැවරීමට බැඳීමක් නොමැති විටදී අභිමතානුසාරී ලාභාංශ සහිත සාමාන්‍ය කොටස් ස්කන්ධ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

**(ආ) ලාභාංශ**

ලාභාංශ ලැබීමට කොටස් හිමියන්ගේ අයිතිය ස්ථාපිත කළ විටදී, ලාභාංශ පිළිගනු ලැබේ.ස්කන්ධ කොටස් හිමියන්ගේ අතුරු ලාභාංශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබේ. අවසාන ලාභාංශ ගෙවනු ලබනුයේ කොටස් හිමියන් විසින් වාර්ෂික මහා සම්මේලනයේදී අනුමත කරනු ලැබූ විටදීය.

**1.3.11 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලබාගත් සේවාවන් සඳහා ගෙවීමට ඇති බැඳීම් වෙළඳ ගෙවිය යුතු දෑ වේ. වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීම් සිදුකළ යුතුවේ නම් ඒවා ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර එසේ නොමැති නම් ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කෙරේ.

ආරම්භයේදී සාධාරණ අගය මත වෙළෙඳ ගෙවිය යුතු දෑ හඳුනාගන්නා අතර පසුව සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ. වට්ටම් කිරීමේ බලපෑම නොවැදගත් බැවින් ප්‍රකාශිත පොළී අනුපාතයක් රහිත කෙටි කාලීන ගෙවිය යුතු දෑ ආරම්භක ඉන්වොයිසි කළ ප්‍රමාණයට මනිනු ලැබේ.

**1.3.12 ප්‍රදාන සහ සහනාධාර**

ක්‍රමික පදනමක් මත හානිපූරණය කිරීමට අදහස් කරනු ලබන ආශ්‍රිත පිරිවැය සමග ගැලපීමට අවශ්‍ය කාලසීමාව පුරා ප්‍රදාන සහ සහනාධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

සාධාරණ අගයට ඇති මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළුව වත්කම් ආශ්‍රිත ප්‍රදාන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විලම්බනය කරනු ලබන අතර ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ආදායම ආශ්‍රිත ප්‍රදාන ඒවා ලැබිය යුතු කාල සීමාව තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**1.3.13 ජංගම සහ විලම්භිත බදු ආදායම**

**අ) ජංගම බදු**

වත්මන් සහ පූර්ව කාල සීමා සඳහා ජංගම ආදායම් බදු වත්කම් සහ බැරකම් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණය මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි තදනන්තර සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

**ආ) විලම්භිත බදුකරණය**

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් පිළිගනු ලැබේ. සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම ප්‍රයෝජනයට ගත හැකි බදු අයකළ හැකි ලාභයක් තිබීමේ හැකියාව ඇති ප්‍රමාණයට සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ.

විලම්බිත බදුවල ශුද්ධ ධාරණ ප්‍රමාණය එක් එක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්භිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉඩ දීම පිණිස බදු අයකළ හැකි ප්‍රමාණවත් ලාභයක් පැවැතීම තවදුරටත් සම්භාවී නොවන ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පනවා ඇති හෝ පැනවීමට නියමිත බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව, වත්කම උපලබ්ධි වූ හෝ බැරකම පියවනු ලැබූ වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට අනුව විලම්බිත බදු වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

සමකොටස් තුළ ඍජුවම හඳුනාගෙන ඇති අයිතමයන් ආශ්‍රිත ආදායම් බදු සමකොටස් තුළ පිළිගනු ලැබේ.

ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහා බදු අධිකාරීන් විසින්ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

### 1.3.14 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

වෙනත් පාර්ශවයක මූල්‍ය හෝ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීමට හෝ සැලකිය යුතු බලපෑමක් කිරීමට එක් පාර්ශවයකට හැකියාවක් ඇති විටදී, මිලක් ගෙවන්නේද නැද්ද යන්න නොසළකා, ගනුදෙනුවට අදාළ අනාවරණයන් කරනු ලැබේ. මව් සමාගම සහ පරිපාලිත සමාගම් අතර ගනුදෙනුවක් සිදුවූයේද නැද්ද යන්න නොතකා එම ආශ්‍රිත පාර්ශව අතර සබඳතාවය අනාවරණය කළ යුතුය.

### 1.3.15 සේවක ප්‍රතිලාභ

(අ) සේවක ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම පාරිතෝෂිකය
ප්‍රතිලාභ සඳහා මූල්‍යමය ප්‍රතිපාදන පාරිතෝෂික පනතේ විධිවිධාන යටතේ ගෙවිය යුතු බව 1983 අංක12 දරණ පනතේ ප්‍රතිපාදන සලසා ඇත.මෙම වගකීම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ. සිදුකරන ලද ආයුගණක ඇගයීම මත පාරිතෝෂික බැරකම් පදනම් වේ. ආයුගණක ලාභ හෝ අලාභ ඒවා මතුවූ කාල සීමාවෙහි වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට වැය බරක් වනු ඇත නැතහොත් බැර කරනු ඇත.

සමාගමේ ආයුගණක ඇගයීම ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පුද්) සමාගම විසින් සිදුකළ ආයුගණක ඇගයීම් මත පදනම් වේ. ආයුගණක ඇගයීම, වට්ටම් අනුපාත සහ අනාගත වැටුප් වර්ධක පිළිබඳ උපකල්පන සිදුකිරීම හා සම්බන්ධ වේ. මෙම ඇගයීමේදී, ඇගයීමේ සංකීර්ණතාව, පාදක කරගත් උපකල්පන සහ ඒවායේ දිගු කාලීන ස්වභාවය, **අර්ථදැක්වූ** ප්‍රතිලාභ බැඳීම් වෙනස්වීම්වලට අතිශයින් සංවේදී වේ. සියලු උපකල්පන එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. ඇගයීමේදී භාවිතා කළ ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර 24 වන සටහනෙහි දැක්වේ. භාවිතා කළ ප්‍රධාන උපකල්පන වනුයේ මරණඅනුපාතය, දුබලතා අනුපාත සහ ආපසු ගැනීමේ අනුපාතයි. අවසන් වැටුප් විශ්‍රාම යෝජනා ක්‍රමයක් සඳහා ප්‍රතිපාදන සැලසීමේ වේගය නිර්ණය කිරීමේදී වට්ටම් අනුපාතය සහ වැටුප් අනුපාත පිළිබඳ උපකල්පන තීරණාත්මකව වැදගත් වේ.

**(ආ) අර්ථදැක්වූ දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා සේවකයන් හිමිකම් ලබයි. සමාගම සේවකයන්ගේ දළ වේතනවලින් 12% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා අනුපිළිවෙලින් දායක කරයි.

### 1.3.16 ප්‍රතිපාදන

අතිත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික සහ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

එක හා සමාන බැඳීම් කිහිපයක් ඇතිවිටදී, බැඳීම් පංතිය සමස්තයක් ලෙස සලකා බැලීම මගින්, ඒවා පියවීම සඳහා මුදල් ගලායාමක් අවශ්‍ය කරනු ලැබීම පිළිබඳ භව්‍යතාව නිර්ණය කරනු ලැබේ. සමාන බැඳීම් පංතියක ඇතුලත් කොට ඇති කවර හෝ එක් අයිතමයකට අදාළ මුදල් ගලා යාමේ භව්‍යතාව සුළු වුවත් ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

### 1.3.17 බැඳීම්

වාර්තාකරන දිනය වන විට පැවැති සියලු ද්‍රව්‍යමය බැඳීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 1.3.18 ආදායම පිළිගැනීම

සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලදි සපයන ලද සේවා සඳහා ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමින් ආදායම් සමන්විත වේ. තැරව්කාර ගාස්තු, විකුණුම් වියදම් සහ පිරිවැටුමට අදාළ අනෙකුත් බදු අඩුකොට ඉන්වොයිස් කරන ලද වටිනාකමට ආදායම වාර්තා කරනු ලැබේ.

**(අ) භාණ්ඩ විකිණීම**
ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ.වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති ලැබිය යුතු ගෙවීම ගැන විශ්වාසය තැබිය හැකි සහ ආශ්‍රිත පිරිවැය සහ භාණ්ඩ එවීමේ ඉඩපිළිගත හැකි මට්ටමට මැනිය හැකිවිට දී ආදායම හඳුනාගනුලැබේ.

(ආ) **පොළී ආදායම**
සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) **ලාභාංශ ආදායම**
ගෙවීම ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විටදී ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) **වෙනත් ආදායම**
වෙනත් ආදායම උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

**1.3.19 වියදම**

ආදායම උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්වයකින් පවත්වාගෙන යාම පිණිස දරන ලද සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

විස්තීරණ ආදායම් ප්‍රකාශ තොරතුරු ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් වර්ගීකරණය පිණිස වියදමේ ශ්‍රිතක්රමවේදය යොදා ගෙන ඇත.

**2. නිකුත් කරන ලද එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කර ඇති එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති සහ අර්ථ නිරූපණ පහත හෙළිදරව් කොට ඇත. ඒවා බලාත්මක වූ විටදී, අදාළ කරගත යුතු වන්නේ නම්, එම ප්‍රමිති යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

**i. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 - මූල්‍ය සාධනපත්‍ර**

SLFRS 9 මගින් LKAS 39 ප්‍රතිස්ථාපනය කරන අතර වර්ගීකරණය සහ මැණීම, හානිය සහ මූල්‍ය වත්කම් සහ සහ වගකීම් හානිය සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය හා අදාළ වේ.

SLFRS 9 පහත දැක්වෙන දෑ වෙනස් කරනු ඇත.

- ලාභ හා පාඩු හරහා සාධාරණ වටිනාකමට මණිනු නොලබන සියලු මූල්‍ය වත්කම් සඳහා නව අපහායන අවශ්‍යතා
- මූල්‍ය වත්කම් සඳහා පූර්වයෙන් අවසානයකට ගෙන එන ලද වර්ගීකරණ සහ මැණීම් අවශ්‍යතාවල සංශෝධන

SLFRS 9යටතේ, ණය සිදුවීමක් තව දුරටත් ණය අලාභ පිළිගැනීමට පෙර සිදුවීම අවශ්‍ය නොවන බැවින් අපහායන ආදර්ශය වඩා 'ඉදිරි දැක්මක්' සහිත ආදර්ශයක් වේ. අනෙකුත් විස්තීරණ ආදායම හරහා ක්‍රමක්ෂිත පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට මණිනු ලබන මූල්‍ය වත්කම් සඳහා අස්තිත්වයක් දැන් සැමවිටම (අවම වශයෙන්) මාස 12 ක් සඳහා අපේක්ෂිත ලාභ හෝ අලාභ හඳුනාගනු ඇත. මූලික පිළිගැනීමෙන් පසු ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් පවතින විටදී මෙම වත්කම් මත ජීවිත කාලය පුරා අපේක්ෂිත අලාභ හඳුනාගනු ඇත.

අනෙකුත් වෙනස්කම්වලදී, SLFRS 9හුදෙක්ම මුල් ණය මුදල සහ පොලිය ගෙවීම සඳහා වන ගෙවීම් ඇති කරන්නා සේ සලකනු ලබන මූල්‍ය වත්කමක ගිවිසුම්කර මුදල් ප්‍රවාහ සඳහා අවශ්‍යතා පැහැදිළි කරන් අතිරේක යෙදුම් මාර්ගෝපදේශ ද හඳුන්වා දෙයි.

අනෙකුත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගය ලෙස ණය සාධනපත්‍ර සඳහා තෙවන මැණීම් කාණ්ඩයක් ද එකතු කරනු ලැබ තිබේ. හුදෙක්ම මුල් ණය මුදල සහ පොලිය ගෙවීම සඳහා වන ගෙවීම් ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ගතිලක්ෂන පරීක්ෂණය සපුරාලන විටදී සහ අස්තිත්වය ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙක සඳහාම මූල්‍ය සාධනපත්‍ර රඳවා ගෙන සිටින විටදී එය අදාළ වේ.

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය කාල සීමාව සඳහා බල පවත්වනු ඇත.

SLFRS 9 මුල්වරට යොදාගැනීම, මූල්‍ය සාධනපත්‍ර සඳහා වන ගිණුම්කරණය මත පුළුල් සහ විහව්‍යව ඉතා වැදගත් බලපෑමක් ඇති කරනු ඇත. ණය සහ අත්තිකාරම්, ලැබිය යුතු කල්බදු කුලී, කුලී පිට ගැණුම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මණිනු නොලබන අනෙකුත් මූල්‍ය සාධන පත්‍ර සඳහා නව අපහායන අවශ්‍යතා සැලකිය යුතු වෙනස්කම් ඇති කරනු ඇත.

මෙම ප්‍රමිතියේ බලපෑම පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සමාගම මෙතෙක් සිදුකර නොමැත.

ii) SLFRS 15 -පාරිභෝගිකයන් සමග ගිවිසුම්වලින් ලදආදායම

පාරිභෝගිකයන් හට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පැවැරීම නිරූපණය වීම පිණිස එම භාණ්ඩ සහ සේවා හුවමාරුව සඳහා අස්තිත්වය හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව පිළිබිඹු වන ප්‍රමාණයකට අස්තිත්වයක් ආදායම පිළිගනු ඇත. මින් අදහස් වනුයේ ‘LKAS 18’ආදායම යටතේ වත්මනෙහි පවතින ආකාරයට අවදානම් සහ පරිදාන පවරනවාට වඩා භාණ්ඩ හෝ සේවා පාලනය පවරනු ලැබූ විටදී ආදායම පිළිගන්නා බවයි.

මෙය සාක්ෂාත් කරගැනීම සඳහා, SLFRS 15 පියවර පහේ ආදර්ශය යොදා ගැනීම අවශ්‍ය කෙරේ.

1. ගිවිසුම හඳුනාගැනීම
2. කාර්යසාධන බැඳීම් හඳුනාගැනීම
3. ගනුදෙනු මිල නිර්ණය කිරීම
4. එක් එක් කාර්යසාධන බැඳීම සඳහා ගනුදෙනු මිලක් වෙන් කිරීම
5. එක් එක් කාර්යසාධන බැඳීම සපුරාලනු ලැබූ විටදී ආදායම පිළිගැනීම

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය කාල සීමාව සඳහා බල පවත්වනු ඇත.

මෙම ප්‍රමිතියේ බලපෑම පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සමාගම මෙතෙක් සිදුකර නොමැත.

iii) පහත දැක්වෙන නව ගිණුම්කරණ ප්‍රමිති සහ පවතින ප්‍රමිති සඳහා සංශෝධන මූල්‍ය ප්‍රකාශ මත බලපෑමක් කරනු ඇතැයි අපේක්ෂා නොකරයි.

කෘෂිකර්මය: ඵල දරන පැල ( ‘දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ LKAS 16 සහ ‘කෘෂිකර්මය’ පිළිබඳ LKAS 41 සඳහා සංශෝධන)

නියාමන විලම්බන වත්කම් - SLFRS 14 - බලාත්මක දිනය 2016 ජනවාරි 01 වනදා

| | | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **3** | **ආදායම** | | |
| | දළ විකුණුම් | 8,856,788,872 | 7,739,513,356 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | (177,323,567) | (154,785,579) |
| | | 8,679,465,305 | 7,584,727,777 |
| **4** | **වෙනත් ආදායම්** | | |
| | අබලි විකුණුම් | 800,235 | 481,018 |
| | කුලී ආදායම | 72,202 | 61,359 |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 2,328,000 | 3,552,000 |
| | දඩ සහ අධිභාර | 356,326 | 533,549 |
| | කිරිපිටි අලෙවි සහනාධාර | 222,910,700 | 93,527,650 |
| | ආපසු නොගෙවන තැන්පතු | 254,500 | 645,000 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 546,000 | 940,000 |
| | විලම්භිත ආදායම | 21,697,268 | 22,222,444 |
| | හුවමාරු වාසි | 14,190,678 | 67,851,169 |
| | ගව ආහාර ඉපයුම් | - | 546,425 |
| | විවිධ ආදායම් | 196,277 | 430,483 |
| | අගරු වූ චෙක්පත් සඳහා අධිභාර | 1,123,986 | 974,464 |
| | අධි වෙන් කිරීම ලාභයට පුනස්ථානය කිරීම | - | 161,291,918 |
| | | 264,476,173 | 353,057,479 |
| **5** | **වෙනත් වියදම්** | | |
| | දියර කිරි විකිණීමෙන් අලාභය | (203,925) | 1,677,269 |
| | කිරි මාරුකිරීම මත අලාභය | 4,482,684 | 11,235,041 |
| | කිරි සහනාධාර ගෙවීම සඳහා ප්‍රතිපාදනය | - | 54,864,721 |
| | | 4,278,759 | 67,777,030 |
| **6** | **මූල්‍ය ආදායම** | | |
| | ඉල්ලුම්/ස්ථාවර තැන්පතු මත පොළිය - දේශීය | 33,685,575 | 40,738,354 |
| | ස්ථාවර තැන්පතු මත පොළිය - විදේශ විනිමය (ඇඩො) | 21,915,550 | 25,938,787 |
| | කාර්ය මණ්ඩල ණය මත පොළිය | 6,477,317 | 6,399,071 |
| | | 62,078,442 | 73,076,212 |

| | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. |
|---|---|---|
| **7 මූල්‍ය පිරිවැය** | | |
| මූල්‍ය කල්බදු මත පොළිය | 3,449,991 | 9,267,133 |
| ණය මත පොළිය | 36,791,050 | 54,401,805 |
| බැඳීම් ගාස්තු | - | 5,296,525 |
| බැංකු අයිරා මත පොළිය | 11,434,400 | 39,111,127 |
| | 51,675,441 | 108,076,590 |

**8 බදුවලට පෙර ලාභය**

පහත දෑ ඇතුළුව සියලු වියදම් අයකිරීමෙන් පසුව බදුකරණයට පෙර ලාභය ප්‍රකාශ කර තිබේ.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය | 4,520,000 | 6,807,283 |
| විගණන සේවා | | |
| - අභ්‍යන්තර විගණන සේවා | 3,337,005 | 1,454,847 |
| - බාහිර විගණන සේවා | 650,000 | 603,750 |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම | 268,073,500 | 260,027,049 |
| ජා.ගො.බ. වියදම් | 177,323,567 | 154,785,579 |
| වෙළෙඳ ප්‍රචාරණ සහ අලෙවි ප්‍රවර්ධන | 57,130,315 | 44,522,488 |
| නෛතික වියදම් සහ වෘත්තීය ගාස්තු | 2,249,738 | 3,686,232 |
| අපහායන ප්‍රතිපාදනය | 2,599,134 | 993,655 |
| අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 31,783,468 | 57,577,896 |
| කාර්ය මණ්ඩල පිරිවැය | | |
| - වැටුප් වේතන සහ සමාන වියදම් | 748,407,292 | 833,843,988 |
| - නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ හා සේ,භා.අ. | 153,339,657 | 82,323,454 |
| - නිර්වචිත දායක සැලැසුම් පිරිවැය - පාරිතෝෂිකය | 82,436,290 | 35,701,251 |

| | | සටහන | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. |
|---|---|---|---|---|
| **9** | **ආදායම් බදු වියදම්** | | | |
| | වර්තමාන ආදායම් බදු ප්‍රතිපාදනය | **9.1** | 17,809,248 | 15,932,842 |
| | වසර සඳහා විලම්භිත බදු ගාස්තුව | **22** | 3,449,433 | 4,535,056 |
| | වෙනත් විස්තීර්ණ ආදායම්වලට විලම්භිත බදු ගාස්තුව | | (9,011,764) | (4,350,646) |
| | | | 12,246,918 | 16,117,252 |

**9.1 ප්‍රවර්තන බදු ( ආදායම්)/ වියදම් සහ ගිණුම්කරණ ලාභ/ (අලාභ) ඉපැයුම අතර සැසඳීම**

| | | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| බදුවලට පෙර ගිණුම්කරණ ලාභය | | 339,331,549 | 3,817,741 |
| අඩු කළා: | වෙනමම සැලකූ ආදායම | (62,078,442) | (73,076,212) |
| | වෙළෙඳාම හෝ ව්‍යාපාරයෙන් ලද ලාභය | 277,253,107 | (69,258,471) |
| අඩු කළා: | බදු කාර්යයන් සඳහා ශුද්ධ ඉඩ දිය හැකි සහ නොහැකි වියදම් | (43,427,564) | 267,241,697 |
| | ව්‍යාපාර (අලාභ)/ ලාභ අදාළ කරගත් යුතු බදුකරණය | 233,825,542 | 197,983,226 |
| | බදු ප්‍රතිශතය | 10% | 10% |
| | අනෙකුත් ආදායම් නිදහස් කිරීම | 21,915,550 | 25,938,787 |
| | වගකීමට යටත් වෙනත් ආදායම | 40,162,892 | 47,137,425 |
| | ආදායම් බද්දට අය කළ හැකි ගිණුම්කරණ ලාභය/අලාභය | | |
| | බදු ප්‍රතිශතය | 10% | 10% |
| | අය කළ හැකි ලාභය හෝ ආදායම මත බද්ද | 27,398,843 | 24,512,065 |
| | 32 වන වගන්තිය යටතේ අඩු කිරීම මත බදු බලපෑම | (9,589,595) | (8,579,223) |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදනය (10% ට ගලපන ලද ආදායම මත බදු) | 17,809,248 | 15,932,842 |

**9.2** දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ විධිවිධාන ප්‍රකාරව විදේශ ආයෝජනවලින් උපදවන ලද ආදායම (විදේශ ව්‍යවහාර මුදලින් ඇති ස්ථාවර තැන්පතු) ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

**10 සාමාන්‍ය කොටසක් සඳහා ඉපැයුම්/ අලාභය**

කොටසක් සඳහා මූලික ඉපැයුම ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස් දරන්නන්ට ආරෝපිත ශුද්ධ ලාභය/අලාභය නිකුත් කරනු ලැබූ බරතැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීම මගිනි.

| | 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු |
|---|---|---|
| සාමාන්‍ය කොටස් වෙත ආරෝපණීය ශුද්ධ ලාභය/අලාභය | 327,084,631 | (12,299,511) |
| සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාව | 31,945,406 | 31,945,406 |
| | 10.24 | (0.39) |

**10.1 කොටසක් සඳහා තනුක ඉපැයුම්**

සමාගමේ භව්‍ය තනුක සාමාන්‍ය කොටස් නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, කොටසක් සඳහා තනුක ඉපැයුම් ඉහත පෙන්වා දී ඇති පරිදි කොටසක් සඳහා මූලික ඉපැයුම (අලාභය) වේ.

**11 දේපළ, පිරියත සහ උපකරණ**

**අ) ස්පෘශ්‍ය වත්කම්**

| වත්කම් විස්තරය | පිරිවැය/ඇගයීම ශේෂය 01.01.2016 දිනට රු. | එකතු කිරීම් රු. | CWIP වෙතින් මාරු කිරීම් රු. | ශේෂය 31.12.2016 දිනට රු. | ක්ෂය වීම ශේෂය 01.01.2016 දිනට රු. | වසර සඳහා ගාස්තුව රු. | ශේෂය 31.12.2016 දිනට රු. | ලියා හළ අගය 01.01.2016 දිනට රු. | 31.12.2016 දිනට රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සින්නක්කර** | | | | | | | | | |
| ඉඩම් | 3,250,000 | - | - | 3,250,000 | - | - | - | 3,250,000 | 3,250,000 |
| ගොඩනැගිලි | 145,660,472 | 4,777,552 | - | 150,438,024 | 55,363,896 | 6,960,836 | 62,324,732 | 90,296,576 | 88,113,292 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 1,868,872,562 | 21,330,687 | 104,177,781 | 1,994,381,030 | 659,775,637 | 178,397,305 | 838,172,942 | 1,209,096,925 | 1,156,208,089 |
| ගෘහ භාන්ඩ සහ සවිකිරීම් | 36,031,688 | 3,003,151 | - | 39,034,839 | 29,189,178 | 2,462,022 | 31,651,200 | 6,842,510 | 7,383,639 |
| රසායනගාර උපකරණ | 46,050,570 | 14,968,868 | - | 61,019,438 | 34,082,544 | 5,217,375 | 39,299,919 | 11,968,026 | 21,719,519 |
| මෝටර් වාහන | 108,978,752 | - | - | 108,978,752 | 98,275,189 | 7,812,223 | 106,087,412 | 10,703,563 | 2,891,340 |
| මෙවලම් සහ උපකරණ | 206,463,150 | 63,939,828 | - | 270,402,978 | 190,540,697 | 10,559,904 | 201,100,601 | 15,922,453 | 69,302,377 |
| බෝතල් සහ ඇසුරුම් භාජන | 276,786,330 | 19,429,465 | - | 296,215,795 | 248,967,819 | 16,002,706 | 264,970,525 | 27,818,511 | 31,245,270 |
| පරිගණක උපකරණ | 27,184,078 | 2,356,077 | - | 29,540,155 | 21,474,656 | 2,302,098 | 23,776,754 | 5,709,422 | 5,763,401 |
| බෝතල් සිසිල්කරණ | 137,790,512 | 669,497 | - | 138,460,009 | 85,427,336 | 21,078,111 | 106,505,447 | 52,363,176 | 31,954,561 |
| කාර්යාල උපකරණ | 6,406,861 | 419,655 | - | 6,826,516 | 5,442,808 | 470,180 | 5,912,988 | 964,053 | 913,528 |
| කිරි භාජන | 56,539,486 | 3,400 | - | 56,542,886 | 46,244,863 | 3,100,618 | 49,345,481 | 10,294,623 | 7,197,405 |
| | 2,920,014,461 | 130,898,179 | 104,177,781 | 3,155,090,421 | 1,474,784,623 | 254,363,377 | 1,729,148,000 | 1,445,229,838 | 1,425,942,421 |
| **ආ) අස්පෘශ්‍ය වත්කම්** | | | | | | | | | |
| පරිගණක මෘදුකාංග | 2,587,209 | - | - | 2,587,209 | 2,587,209 | - | 2,587,209 | - | - |
| **ඇ) බදුකර වත්කම්** | | | | | | | | | |
| මෝටර් වාහන | 48,000,958 | 13,040,000 | - | 61,040,958 | 13,244,338 | 13,710,123 | 26,954,461 | 34,756,620 | 34,086,497 |
| **එකතුව** | 2,970,602,628 | 143,938,179 | 104,177,781 | 3,218,718,588 | 1,490,616,170 | 268,073,500 | 1,758,689,670 | 1,479,986,458 | 1,460,028,918 |

**11.1 ප්‍රත්‍යාගණන**

2008 අප්‍රේල් වන විට ගොඩනැගිලි, බෝතල් හා ඇසුරුම්, පරිගණක මෘදුකාංග, කිරි බඳුන් හැර මිල්කෝ සමාගම වරලත් ආගණන සමීක්ෂක එස්.එන්. විජේපාල මහතා ( ආගණන ඩිප්ලෝමාධාරී, විද්‍යාවේදී, වතු කළමනාකරණය විද්‍යාපති - නාගරික ඉඩම් තක්සේරුව) ලවා සිය වත්කම් රු. 500,409,271= ක සමාහාර වටිනාකමකට ප්‍රත්‍යාගණනය කරනු ලැබිය. රු. 336,454,462ක් වූ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය ප්‍රත්‍යාගණන ගිණුමට බැර කරන ලදී. ප්‍රත්‍යාගණන සංචිතය 2009 මාර්තු 31 දිනට ගිණුම් ගත කළ බැවින්, වසර සඳහා ක්ෂය අයකිරීම් මත බලපෑමක් තිබේ.

| | | ශේෂය 01.01.2016 දිනට රු. | කාල සීමාව තුළ දරන ලද රු. | කාල සීමාව තුළ ප්‍රාග්ධනිත රු. | ශේෂය 31.12.2016 දිනට රු. |
|---|---|---|---|---|---|
| 12 | **නොනිමි ප්‍රාග්ධන වැඩ** | | | | |
| | අපජලය පිරියම්කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම | 16,345,529 | - | - | 16,345,529 |
| | බඩල්ගම නව කිරි කර්මාන්ත ශාලාව ඉදිකිරීම | 429,172,328 | 4,402,618,839 | - | 4,831,791,167 |
| | ගැටඹේ අලෙවිහල ඉදිකිරීම | 150,000 | - | - | 150,000 |
| | කෝප්ප සහ කොන් පිලරය - DMF | 15,445,587 | - | - | 15,445,587 |
| | දිගන ආපන ශාලාව | 1,315,623 | 692,216 | 2,007,839 | - |
| | යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රාගාරය | 104,177,780 | - | 104,177,780 | - |
| | කර්මාන්තශාලා නවීකරණය - පොලොන්නරුව, අඹේවෙල සහ දිගන ( සටහන 22 බලන්න) | 6,167,678,958 | 21,895,870 | - | 6,189,574,828 |
| | කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන - දිගන | 1,495,674 | 166,186 | 1,661,860 | - |
| | බලශක්ති උත්ශ්‍රේණිගත කිරීමේ ව්‍යාපෘතිය- SDMF | - | 68,895,393 | - | 68,895,393 |
| | සංවර්ධනය කෙරෙන ලොරි වැසිය -PMF | - | 6,965,000 | - | 6,965,000 |
| | ශීතකරණ මධ්‍යස්ථානවල විදුලි ජනක යන්ත්‍ර ස්ථාපනය | - | 3,383,693 | - | 3,383,693 |
| | | 6,735,781,479 | 4,504,617,197 | 107,847,479 | 11,132,551,197 |

**12.1** මෙම මූල්‍ය ප්‍රකාශනවල 23 වන සටහනේ විස්තර කර ඇති පරිදි, ඉහත කර්මාන්තශාලා නවීකරණය සහ බඩල්ගම නව කිරි කර්මාන්ත ශාලාව ඉදිකිරීම ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කරන ලද ණය මුදලකින් මූල්‍යායනය කරන ලදී.

| | | | 2016 දෙසැම්බර් 31 දිනට | 2015 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **13** | **දීර්ඝ කාලීන අත්තිකාරම්** | | | |
| | **DESMI වෙත අත්තිකාරම -කොළඹ කිරි කර්මාන්ත ශාලාව බඩල්ගම පුනස්ථාපනය කිරීම** | | | |
| | වසර ආරම්භයේදී ශේෂය | | 3,077,925,645 | - |
| | වසර තුළ ගෙවන ලද අත්තිකාරම් | | - | 3,077,925,645 |
| | නොනිමි ප්‍රාග්ධන වැඩ වෙත මාරු කළ | | (1,320,785,652) | - |
| | වසර අවසානයේ ශේෂය | | 1,757,139,993 | 3,077,925,645 |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි 28 (ආ) සටහනෙහි විස්තර කර ඇති පරිදි, බඩල්ගම කිරි පිරිසැකසුම් යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම මූල්‍යයනය කරනු ලැබුයේ ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කරන ලද ණය මුදලකිනි. 2015/10/22 දින, ලංකා රජයේ භාණ්ඩාගාරය යුරෝ 19,180,692 කට (කොන්ත්‍රාත් වටිනාකමින් 30%ක්) සමාන මුදලක අත්තිකාරම් ගෙවීමක් කරන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| **14** | **තොග** | | | |
| | අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය | **14.1** | 251,076,100.59 | 172,177,777 |
| | නොනිමි වැඩ | | 4,967,059.48 | 6,282,572 |
| | නිමි භාණ්ඩ | | 258,751,809.18 | 153,986,791 |
| | පරිභෝජන ද්‍රව්‍ය | **14.2** | 328,656,572 | 292,150,329 |
